# යුක්තිය නැතුව වසර හයක්

*පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන දේශපාලන, සමාජ-සංස්කෘතික, ආර්ථික  සහ නීතිමය ඇසින්*

*පර්යේෂණ කණ්ඩායම*
*සමාජය සහ සාමයික කේන්ද්‍රය*

# මූලික සාරාංශය

2019 අප්‍රේල් 21 වැනිදා පාස්කු ඉරිදා සිදු කළ ප්‍රහාරයේදී කතෝලික දේවස්ථාන දෙකක් සහ ක්‍රිස්තියානි දේවස්ථානයක් ද, සුඛෝපභෝගී හෝටල් තුනක්, නවාතැන්පළක් සහ නිවසක්[1] ද ඉලක්ක කර තිබුණු අතර යුද්ධයෙන් පසු මෙරට සිදු වූ කුරිරුතම සංහාරය ලෙස එය සැලකිය හැකිය. දෙවියන් වහන්සේ ඉදිරියෙහි දණින් වැටී සිටි සිය ගණනක් වූ අහිංසක බැතිමතුන්ගේ සහ පාස්කු ඉරු දින උදෑසන පාතරාසය භුක්ති විඳිමින් සිටි සිය ගණනකගේත් තවත් අයගේත් ජීවිත අමානුෂික ලෙස විනාශ කරන ලද අතර බොහෝ දෙනෙකුට ශාරීරික හා මානසික වශයෙන් මාරාන්තික තුවාල ඇති විය. මෙමඟින් විපතට පත් වූවන් සංඛ්‍යාව අවිනිශ්චිත වන නමුත්, මරණ 259-315[2] අතර ප්‍රමාණයක් සිදුවූ අතර 600 කට පමණ තුවාල සිදුවූ බවට විශ්වාස කෙරේ. ළමුන් 45 දෙනෙකු සහ විදේශිකයන් 40 දෙනෙකු මිය ගොස් ඇති බව ලෝකයේ විවිධ ප්‍රදේශවලින් වාතර්‍ා වූ අතර එය මෙම ඛේදවාචකය පිළිබඳ ජාත්‍යන්තර අවධානය අවදි කිරීමට ද හේතුවක් විය. ප්‍රහාරයට ගොදුරු වූ බොහෝ දෙනෙකු තවමත් ප්‍රතිකාර ලබමින් හා ශල්‍යකමර්වලට මුහුණ දෙමින් සිටින අතර මෙම බිහිසුණු අත්දැකීම හේතුවෙන් ඔවුන් මුහුණ දෙන පශ්චාත් ව්‍යසන ආතති ආබාධ (PTSD) සඳහා උපදේශන සේවා අවශ්‍ය වේ. පාස්කු ප්‍රහාරයේ අන්ධකාර සෙවණැල්ල ශ්‍රී ලංකා ඉතිහාසයෙන් කිසිදා මැකී නොයනු ඇත. තම ආදරණීයයන් අහිමි වූ වින්දිතයෝ යුක්තිය ඉල්ලා සිටින අතරේ තවමත් තම අදාරණීයයන්ගේ වියෝව ගැන දුක් වෙති. 2024 අප්‍රේල් 21 වන දිනට ප්‍රහාරය සිදුවී වසර පහකි. තවමත් යුක්තිය ඉටු වී නැති අතර විපතට පත් වූ සියලු දෙනා තවමත් එහි අවසානයක් බලාපොරොත්තුවෙන් සිටිති.

සහරාන් හෂීම්ගේ නායකත්වයෙන් යුත් ජාතික තව්හීද් ජමාත් (NTJ)[3] නමින් හැඳින්වෙන කණ්ඩායමක් ප්‍රහාරයන්ට වගකිව යුතු බවට තමන් විශ්වාස කරන බව ප්‍රහාරයෙන් පසු දින ශ්‍රී ලංකා බලධාරීහු කියා සිටියහ. සති අන්තයේ දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ප්‍රකාශ කළේ ප්‍රහාර පිටුපස සිටි ප්‍රධාන කණ්ඩායම NTJ යැයි විශ්වාස කරන බවයි. ප්‍රහාරවලට සම්බන්ධ වූ NTJ මෙන්ම ජමාතෙයි මිල්ලාතු ඊබ්‍රාහිම් (JMI) යන සංවිධාන තහනම් කළ බව නිවේදනය කරන ලදි. කෙසේ වෙතත්, ප්‍රහාරය පිටුපස සිටි අය ගැන සාකච්ඡා කිරීමේදී නොසලකා හැරිය නොහැකි අංගයක් වන්නේ පාස්කු ප්‍රහාරය ශ්‍රී ලංකා රාජ්‍යයේ දැවැන්ත ආරක්ෂක බිඳවැටීමක් නිසා සිදු වූ බවයි[4]. කතෝලික පල්ලිය සහ මානව හිමිකම් ප්‍රජාව ඇතුළු බොහෝ දෙනෙකු විශ්වාස කරන්නේ බෝම්බ ප්‍රහාර පිටුපස ඇති සත්‍යය බලධාරීන් විසින් වසන් කරනු ලබන බවයි[5]. බුද්ධි අංශ දිගු කලක් තිස්සේ අන්තවාදී කණ්ඩායම් ගැන දැන සිටි බවත්, දේවස්ථානවලට ප්‍රහාරයක් එල්ල විය හැකි බවට පෙර තොරතුරු ලැබී තිබුණු බවටත්,[6] ඉහළ නිලධාරීන් පවා එය දැන සිටි බවත්[7], බුද්ධි අංශ සහ තවත් සමහර සැකකරුවන් අතර නොපැහැදිලි සබඳතා තිබුණු  බවටත් කරුණු අනාවරණය විය[8]. ප්‍රහාර පිළිබඳ නොසලකා හරින ලද අනතුරු ඇඟවීම්, ප්‍රහාර බාධාවකින් තොරව සිදු කළ ආකාරය සහ යුක්තිය ඉටු කිරීම සඳහා රජයේ පසුගාමී ප්‍රවේශය ප්‍රහාර පිටුපස සිටින සැබෑ මහ මොළකරුවන් කවුරුන්ද යන්න පිළිබඳව ප්‍රශ්න මතු කරයි. මෑතකදී ප්‍රකාශයට පත් කළ චැනල් 04 වාතර්‍ා චිත්‍රපටය රජයේ ඉහළ නිලධාරියකුගේ අදාළත්වය සහ රාජපක්ෂ පාලනය සමඟ ඔහුගේ සබඳතාව ඉස්මතු කරයි. කෙසේ වෙතත්, ඉදිරිපත් කර ඇති කරුණු තවදුරටත් විමශර්නය කිරීම අවශ්‍ය වේ[9]. ප්‍රහාර සඳහා පාර කැපූ තවත් සාධකයක් වන්නේ එවකට රටේ පැවැති දේශපාලන අස්ථාවරත්වයයි. 2018 වසරේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණය අසාථර්ක වීමෙන් පසු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ අතර පැවති දුවර්ල සබඳතාව ජාතික ආරක්ෂාව දුවර්ල කර නීති විරෝධී අරමුණු සාථර්ක කිරීමට ඉවහල් විය. අපරාධය කළවුන් තවමත් නිදහස භුක්ති විඳිමින් එළියේ සිටින අතර වින්දිතයන්, දිවි ගලවා ගත් අය සහ ඔවුන්ගේ ආදරණීයයෝ තවමත් හිස් බැල්මෙන් යුතුව සුසුම්ලමින් නිශ්චලව සිටිති. දැන් උත්සාහය වන්නේ ප්‍රහාර පිටුපස ඇති සත්‍යය විමශර්නය කිරීමේ ක්‍රියාවලියට උපකාර කිරීම සඳහා විශ්වාසදායක ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමයි.

පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූවන් වෙනුවෙන් යුක්තිය පසිඳලීමේ අදියරේදී රජය විසින් ඉස්ලාමීය කණ්ඩායම් දෙකට සම්බන්ධ බොහෝ පුද්ගලයන් අත්අඩංගුවට ගන්නා ලදි. එහෙත් සාපරාධී නොසැලකිල්ල සම්බන්ධයෙන් චෝදනා ලබා අත්අඩංගුවට ගත් එකම රජයේ නිලධාරීන් වන්නේ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු සහ හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර පමණි. ප්‍රහාරයේ වින්දිතයින්ට සහ දිවි ගලවා ගත් අයට මූල්‍යමය වශයෙන් වන්දි ගෙවනු ලැබේ. ආදරණීයයන් අහිමි වූ සහ තුවාල වූ පුද්ගලයින්ගේ පවුල්වලට උපකාර කිරීම සඳහා හානිපූණර් කායර්ාලය විසින් කටයුතු කරනු ලැබේ.[10] මූලික අයිතිවාසිකම් පෙත්සම් ආශ්‍රිත වධහිංසන සිද්ධිවලට ලබාදෙනු ලබන වන්දි සමග සන්සන්දනාත්මකව සැලකූ කල මෙම වන්දි අඩු මට්ටමක පවතී. අපරාධවල බරපතලකම සහ දිවි ගලවා ගත් අයගේ, වින්දිතයින්ගේ පවුල්වල සහ විපතට පත් ප්‍රජාවේ සංඛ්‍යාව විශාල වීම ද මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

ඊට අමතරව, බොහෝ රාජ්‍ය නොවන සංවිධාන වින්දිතයින්ට ඔවුන්ගේ වෛද්‍ය අවශ්‍යතා සපුරාලීමට සහ ආර්ථික ස්ථාවරත්වයට ළඟා වීමට උපකාර කිරීමේලා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි. මීට අමතරව පාස්කු ප්‍රහාරයට අදාළව පවරා ඇති නඩු සංඛ්‍යාව ද බොහෝය. අපරාධ නඩු 40කට වඩා පවරා තිබුණද, බොහෝ නඩු තවමත් පවතින්නේ නඩු විභාගයේ ආරම්භක අදියරේය.[11] සමාජය හා සාමයික කේන්ද්‍රය සමීපව නිරීක්ෂණය කරන ප්‍රධාන සිද්ධි 11ක මෙම වාතර්ාවේ[1] සාකච්ඡා කෙරේ.

| නඩු අංකය සහ උසාවිය | විස්තර<br>සාරාංශය | අවසන් වරට කැඳවූ දිනය | ඊළඟ දිනය |
|---|---|---|---|
| HC (TAB)2972/21<br>කොළඹ මහාධිකරණය | <u>විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහිව ප්‍රධාන අපරාධ නඩුව</u>.<br>පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ක්‍රියාත්මක කිරීමට කුමන්ත්‍රණය කිරීම, ඊට ආධාර අනුබල දීම ඇතුළු චෝදනා 23,270ක් යටතේ මෙම නඩුව පවරා ඇත.<br>මේ වන විට නඩුව විභාගයේ මූලික අදියරේ පවතී. | 2025<br>පෙබරවාරි 13 | 2025 මාතර්ු 12 |
| HC (TAB)2900/21<br>HC (TAB)2899/21<br>කොළඹ<br>මහාධිකරණය<br>දැන්<br>ශ්‍රේෂ්ඨාධිකරණය | <u>පාස්කු ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හිටපු පොලිස්පතිවරයාට සහ ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව පවරා ඇති නඩු</u><br>පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සහ රාජකාරී පැහැර හැරීම සම්බන්ධයෙන් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු යන අයට අධිචෝදනා ගොනු කරන ලදි. කොළඹ මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල ඒකමතිකව ඔවුන් වෙනුවෙන් සාක්ෂි කැඳවීමකින් තොරව ඔවුන් නිදොස් කොට නිදහස් කිරීමට නියෝග කළේය. මෙම නඩුව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර එහි තීන්දුව අනුව මහාධිකරණ නඩුවේදී විත්තිවාචක කැඳවීමට නියමිතය. | 2024<br>නොවැම්බර් 5 | 2025 පෙබරවාරි 24 |
| පාස්කු ප්‍රහාරයට අදාළ මූලික අයිතිවාසිකම් විභාගයන් 12<br>ශ්‍රේෂ්ඨාධිකරණය | පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වූ පුද්ගලයන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු 12ක් පවරා ඇත. එම පෙත්සම්වල නම් කර ඇති වගඋත්තරකරුවන්ට ආසන්නයේදී සිදු විය හැකි ප්‍රහාරයක් පිළිබඳ විශ්වසනීය තොරතුරු තිබියදීත් පාස්කු ඉරිදා ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වූ බවත්, එමගින් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය. තීන්දුවට අනුකූල වීම සඳහා වන්දි ගෙවීම සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාගර් reparations.gov.lk වෙබ් අඩවියෙන් සොයාගත හැකිය. | 2024 ජූලි 15 | 2024 දෙසැම්බර් 4 |
| HC 78/2021<br>පුත්තලම මහාධිකරණය | <u>හෙජාස් හිස්බුල්ලා සහ තවත් අයට එරෙහි නඩුව</u><br>පාස්කු ප්‍රහාරයේ බෝම්බ ප්‍රහාරකයකු සමඟ සබඳතා පැවැත්වූ සේව් ද පලර්ස් පුණ්‍යායතනයට සම්බන්ධ යැයි කියන නීතිඥ හෙජාස් හිස්බුල්ලාට සහ පුත්තලම අල් සුහයර් පාසලේ විදුහල්පතිට එරෙහිව මෙම නඩුව පවරා තිබේ. දැනට, නඩු විභාගය සිදු වෙමින් පවතී. කෙසේ වෙතත්, හෙජාස්ට සහ විදුහල්පතිට එරෙහි සාක්ෂි දුවර්ල මට්ටමක පවතී. | 2024<br>දෙසැම්බර් 9 | 2025 මැයි 2 සහ 9 |
| 23084/22<br>කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය | <u>මෛත්‍රීපාල සිරිසේනට එරෙහිව පෞද්ගලික පැමිණිල්ලක්</u><br>චෝදනාව වූයේ නොසැලකිලිමත්කමෙන් මරණයට පත් කිරීම සහ/හෝ බරපතළ තුවාල සිදුකිරීම සම්බන්ධ දණ්ඩ නීති සංග්‍රහයේ | 2023 මාතර්ු 17 | - |

[1] මෙය ඉංග්‍රීසි මුල් වාතර්ාවෙහි සිංහල පරිවතර්නයකි. මූලාශ්‍රයන් සහ අන්තගර්තයේ වෙනස්කම් සම්බන්දයෙන් ඉංග්‍රීසි මුල් වාතර්ාව නිවැරදි බව සලකන්න.

| | | | |
|---|---|---|---|
| | වරද සම්බන්ධයෙනි. එය දැනට රිට් පෙත්සමේ නියෝගය නිකුත් කරන තුරු අත්හිටුවා ඇත. | | |
| TAB 4485/21<br>කෑගල්ල මහාධිකරණය | මාවනැල්ල බුදු පිළිම විනාශ කිරීමේ නඩුව<br>ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ විත්තිකරුවන් 16 දෙනෙකුට එරෙහිව මෙම නඩුව පවරා ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ චෝදනා දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ වැරදි බවට අඩු කිරීමෙන් පසු සියලු විත්තිකරුවන් වරද පිළිගත්හ.. මෙම සිද්ධිය පිටුපස ද සිටි පුද්ගලයා පාස්කු ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු වූ සහරාන් හෂීම් බව පසුව අනාවරණය විය. මෙම නඩුව 2023 ජනවාරි 18 වන දින අවසන් කරන ලද අතර විත්තිකරුවන්ට අත්හිටවූ සිරදඬුවම් නියම විය. | 2023 ජනවාරි 18 | නඩුව අවසන් |
| පුත්තලම/TAB 107/2021<br>පුත්තලම මහාධිකරණය | වනාතවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරණ ද්‍රව්‍ය නඩුව<br>මෙම නඩුව පාස්කු ප්‍රහාරයට සම්බන්ධව වනාතවිල්ලුව ප්‍රදේශයෙන් සොයාගත් පුහුණු කඳවුරක් සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙනි. මේ වන විට, විත්තිකරුවන්ගේ පාපොච්චාරණ ස්වේච්ඡාවෙන් ලබාදුන් එකක්ද, බලහත්කාරයෙන් ලබා ගත්තේද යන්න පරීක්ෂා කිරීම සඳහා වැඩිදුර විමශර්නය (voir dire enquiry) සිදුවෙමින් පවතී. | 2025 ජනවාරි 28 | 2025 මාතර්‍ු 18 |
| HC 148/2021<br>පුත්තලම මහාධිකරණය | අහ්නාෆ් ජසීම්ට එරෙහි නඩුව<br>ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ තරුණ කවියෙකු වන අහනාෆ් ජෙසීම්ට එරෙහිව මෙම නඩුව පවරා තිබිණි. මාස 19ක් රඳවාගෙන සිටි අහ්නාෆ්ට ඇප ලැබී ඇති අතර සාක්ෂි නොමැතිකම හේතුවෙන් අත්අඩංගුවට ගෙන මාස 43කට පසු නිදොස් කොට නිදහස් කර නඩුව අවසන් වී ඇත. | 2023 දෙසැම්බර් 12 | නඩුව අවසන් |
| 16235/MR<br>මීගමුව දිසා අධිකරණය | සිවිල් නඩු<br>පාස්කු ප්‍රහාරයෙන් සිදුවූ හානි අයකර ගැනීමේ නඩුව. දැනට එය පූවර් විභාග අදියරේ පවතී. | 2024 ජුනි 28 | 2025 අප්‍රේල් 4 |
| 143/24 රිට් පෙත්සම<br>අභියාචනාධිකරණය | සමාජය සහ සාමයික කේන්ද්‍රය (CSR), එහි අධ්‍යක්ෂ සහ වින්දිතයෙකු විසින් ගොනු කරන ලද රිට් පෙත්සම.<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවධර්න මහතාට එරෙහිව අපරාධ පරීක්ෂණ කටයුතු සහ නඩු කටයුතු ආරම්භ කරන ලෙස පොලිස්පතිවරයාට සහ නීතිපතිවරයාට නියෝග කරමින් මැන්ඩමස් රිට් ආඥාවක් ඉල්ලා සිටී. මෙම නඩුව 2024 මැයි 28 වන දින කැඳවීමට නියමිතය. | 2024 නොවැම්බර් 13 | 2025 පෙබරවාරි 27 |
| CA RTI/11/2023<br>අභියාචනාධිකරණය | මහජන ආරක්ෂක අමාත්‍යාංශයට එරෙහිව RTI නඩුවක්<br>පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වත්මන් පොලිස්පතිවරයා ඇතුළු ඇතැම් පොලිස් නිලධාරීන්ගේ අතපසුවීම් සම්බන්ධයෙන් ගෙන ඇති විනය ක්‍රියාමාගර් පිළිබඳ තොරතුරු ඉල්ලා CSR විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) මත පදනම් වූ ඉල්ලීමක් ගොනු කර ඇත. එම තොරතුරු ලබා නොදීමට අදාලව අභියාචනාධිකරණය ඉදිරියේ නඩු පවරා ඇත. | 2025 ජනවාරි 22 | 2025 මාතර්‍ු 6 |

*සවිස්තර වශුව පහත දැක්වෙන වාතර්ාවේ ඇත: සමාජය සහ ආගමික කේන්ද්‍රය. "ප්‍රධාන පාස්කු ප්‍රහාර උසාවි නඩු 11 ක විශේෂ අවස්ථා (2021 ජනවාරි 1 සිට 2023 ජුනි 21)." සමාජය සහ සාමයික කේන්ද්‍රය, 21 ජුනි 2023. https://easterattack.info/csr-reports/

මෙම වාතර්ාව පාස්කු ප්‍රහාරය පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. දේශපාලන සන්දභර්ය ප්‍රකාශ කිරීම, වින්දිතයන්ගේ නියැදියක් පිළිබඳ අවබෝධයක් ලබා දීම, සමාජ-සංස්කෘතික හා ආථර්ික ප්‍රතිවිපාක සාකච්ඡා කිරීම, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නීතිමය උපදේශනයේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සහ යුක්තිය ඉටු වී නොමැති ආකාරය විශ්ලේෂණය කිරීම එමගින් සිදු කෙරේ.

# අන්තගර්තය

අන්තගර්තය

යුක්තිය නැතුව වසර හයක් ........ 1

*පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන දේශපාලන, සමාජ-සංස්කෘතික, ආර්ථික සහ නීතිමය ඇසින්* ........ 1

පසුබිම ........ 6

දේශපාලන සංදහර්ය: කලබල ........ 7

අනර්ථකාරී ආර්ථික ප්‍රතිවිපාක ........ 11

නීතිමය ඉදිරි දැක්ම: ගොනු කර ඇති නඩු ........ 12

*1. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා ලැබූ පුද්ගලයන් 25 දෙනෙකුට එරෙහි ප්‍රධාන අපරාධ නඩුව- HC (TAB) 2972/21* ........ 12

2. පාස්කු ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම්වරයාට සහ හිටපු පොලිස්පතිවරයාට එරෙහි නඩුව – HC/TAB/2899/21 සහ HC/TAB/2900/21 ........ 13

3. පාස්කු ප්‍රහාරවලට අදාළ මූලික අයිතිවාසිකම් නඩු – SC FR 163/2019, SC FR 165/2019, SC FR 166/2019, SCFR 184/2019, SCFR 188/2019, SC/F2019, SC/9191 /2019, SC FR 195/2019, SC FR 196/2019, SC FR NO. 197/19, SC FR 198/2019, SCFR 293/2019 ........ 13

4. හෙජාස් හිස්බුල්ලා සහ වෙනත් අයට එරෙහි නඩුව- HC 78/2021 ........ 15

5. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට එරෙහි පෞද්ගලික පැමිණිල්ල- 23084/22 ........ 15

6. මාවනැල්ල බුද්ධ ප්‍රතිමා විනාශ කිරීමේ නඩුව- TAB 4485/21 ........ 16

7. වනාතවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරණ ද්‍රව්‍ය නඩුව- පුත්තලම/TAB/107/2021 ........ 16

8. අහ්නාෆ් ජෙසීම්ට එරෙහි නඩුව- HC 148/2021 ........ 17

9. පාස්කු ප්‍රහාරයෙන් සිදුවූ හානි අයකර ගැනීමේ නඩුව- 16235/MR ........ 17

10. නිලන්ත ජයවධර්නට එරෙහි රිට් නඩුව- රිට් 143/24 ........ 18

11. මහජන ආරක්ෂක අමාත්‍යාංශයට එරෙහිව RTI අභියාචනා නඩුව- CA RTI/11/2023 ........ 19

වරදකරුවන් කවුරුද? ........ 19

කරමින් තිබෙන්නේ කුමක්ද? ........ 23

හානිපූරණය ........ 23

යුක්තිය සඳහා ජාතික සහ ජාත්‍යන්තර ව්‍යාපාරය ........ 24

නිදෙර්ශ ........ 26

# පසුබිම

2019 අප්‍රේල් 21 වන දින පාස්කු ඉරිදා උදෑසන දේව මෙහෙය අතරතුර මීගමුව, මඩකලපුව සහ කොළඹ දේවස්ථාන තුනක් සහ ශැන්ග්‍රිලා, සිනමන් ග්‍රෑන්ඩ් සහ කිංස්බරි යන සුඛෝපභෝගී හෝටල් තුනක භෝජන ශාලා උදෑසන ආහාරය අතරතුර ඉලක්ක කර ගනිමින් පාස්කු ප්‍රහාරය සිදු විය.

ප්‍රහාර සිදු වූ ස්ථාන අට [12]:




- ශාන්ත අන්තෝනි දේවස්ථානය, කොළඹ
- ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, මීගමුව
- සියොන් පල්ලිය, මඩකලපුව
- සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, කොළඹ
- ෂැංග්‍රි-ලා හෝටලය, කොළඹ
- කිංස්බරි හෝටලය, කොළඹ
- දෙහිවල - ගල්කිස්ස දෙහිවල සත්වෝද්‍යානය අසල නැවතුම්පළක
- දෙමටගොඩ මහවිල උද්‍යානයේ නිවසක්

මූලාශ්‍රය- *CNN, 'Bombs tear through Sri Lankan Churches and hotels killing 250 people', < https://edition.cnn.com/2019/04/21/asia/sri-lanka-explosions/index.html > Accessed 16th December 2023.*

ප්‍රහාර පිළිබඳ පළමු සිදුවීම පාස්කු ඉරිදා උදෑසන 08:45 ට පමණ වාර්තා වූ අතර මිනිත්තු 20 ක කාලයක් තුළ රට පුරා හෝටල් සහ පල්ලිවල එකවරම මෙන් පිපිරීම් හයක් සිදු විය[13]. මූලික ප්‍රහාරවලින් පැය පහකට පසු, හත්වැනි පිපිරීම වාර්තා වූයේ කොළඹට තදාසන්න ප්‍රදේශයක් වන දෙහිවල සත්වෝද්‍යානය අසල නවාතැන්පොළකදීය. එයින් පැය භාගයකට පසුව, නිලධාරීන් තිදෙනෙකුට මරු කැඳවමින් කොළඹ නගර සීමාව තුළ පිහිටි දෙමටගොඩ මහවිල

උද්‍යානයේ අටවන පිපිරීම සිදු විය. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කරනු ලැබුවේ ISIS මතවාදයේ අනුගාමිකයින් වන ඉස්ලාමීය අන්තවාදීන් විසිනි[14]. වසර 5කට වැඩි කාලයක් ගතවී ඇතත්, විපතට පත්වූවන් සංඛ්‍යාව තවමත් නිශ්චිත නැත. විවිධ මූලාශ්‍ර මගින් වින්දිතයින් සංඛ්‍යාව විවිධාකාරයෙන් උපුටා දක්වන අතර, තම පවුලේ ඥාතීන්ගේ මරණය වෙනුවෙන් වන්දි නොලැබෙන පවුල් ගණනාවක් සිටිය හැකි බැවින් මෙය ඉතා ගැටළු සහගත තත්ත්වයකි. කෙසේ වෙතත්, සියලුම මූලාශ්‍රයන්හි දැක්වෙන්නේ සමස්ත මරණ සංඛ්‍යාව තුළට අවම වශයෙන් ළමුන් 45 ක් සහ විදේශීය ජාතිකයින් 40 ක් ඇතුළුව පුද්ගලයින් 259-315 ක් පමණ ඇතුලත් විය හැකි බවයි. 600 කට ආසන්න පිරිසක් තුවාල ලබා ඇති බව වාර්තා වේ[15]. මියගිය විදේශිකයන් අතර අවම වශයෙන් ඉන්දියානුවන් 12 දෙනෙකු, බ්‍රිතාන්‍ය පුරවැසියන් අට දෙනෙකු, චීන පුරවැසියන් හතර දෙනෙකු සහ ස්පාඤ්ඤය, තුර්කිය, පෘතුගාලය, සෞදි අරාබිය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ස්විට්සලර්න්තය, නෙදර්ලන්තය සහ ඕස්ට්‍රේලියාව යන රටවලින් පැමිණි තවත් අය වෙති[16]. ශ්‍රී ලංකාවේ මිලියන 21.8 ක ජනගහනයෙන් ක්‍රිස්තියානුවන් ප්‍රතිශතය 7.4% ක් පමණක් වූ අතර ඔවුන් බෝම්බ ප්‍රහාරවල ඉලක්කගත ජනගහන කණ්ඩායම විය.




ඊළඟ සතියේ පොලිසිය තවත් බෝම්බ දෙකක් සහ අඩු පුපුරණ බලයක් සහිත ඩෙටනේටර් 80ක් පමණ සොයා ගත්තේය. සැකකාර මහ මොළකරු සහරාන් හෂීම්ගේ පිරිසක් රැඳී සිටි නැගෙනහිර සයින්දමරුදු නගරයේ නිවසක් ද පොලිස් නිලධාරියකු විසින් සෝදිසි කරන ලැබීය. එම සිද්ධියෙන් පසු ආරක්ෂක අංශ සහ සහ ඉස්ලාමීය සටන්කාමීන් යැයි සැක කරන පිරිසක් අතර වෙඩි හුවමාරුවක් ඇති වූ අතර පිපිරීම් කිහිපයක් ද සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස එම නිවසේ සිටි ළමුන් හය දෙනෙකු ඇතුළු 15 දෙනෙක් මිය ගියහ. කල්මුණේ ප්‍රදේශයේම වෙනම නිවාස දෙකක තිබී බෝම්බ සාදන ද්‍රව්‍ය සහ ලෝහ බෝල දහස් ගණනක් සොයා ගන්නා ලදි[17]. හමුදා මාධ්‍ය ප්‍රකාශක සුමිත් අතපත්තු ප්‍රකාශ කළ පරිදි, හට පිරිස් නිවස දෙසට යන විට පිපිරුම් තුනක් සහ වෙඩි තැබීම් ආරම්භ වූ නිසා හට පිරිස් ප්‍රතිප්‍රහාර එල්ල කර තිබේ.[18].

## දේශපාලන සංදර්භය: කලබල

*අන්තවාදී කණ්ඩායම් විසින් මෙහෙයවනු ලැබූ මෙම බිහිසුණු ප්‍රහාරය සඳහා පසුබිම නිර්මාණය කිරීමට රටේ දේශපාලන අස්ථාවරත්වය හේතු විය.*

පාස්කු ප්‍රහාරය සිදුවූයේ යහපාලනය නමින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන රාජ්‍ය පාලනය කරන සමයේදීය. සිද්ධිය වන විට රනිල් වික්‍රමසිංහ මහතා අගමැති විය. ඛේදවාචකය සිදු වූ සමයේ සහ ඊට පෙර දේශපාලන පසුබිම ඉතා අස්ථාවර විය[19]. ඊට හොඳම සාක්ෂිය වන්නේ 2018 ඔක්තෝබර් ව්‍යවස්ථා කුමන්ත්‍රණයකින් මහින්ද රාජපක්ෂ මහතා

අගමැති ධුරයට පත් කර  පාලර්මේන්තුව විසිරුවා හැරීම උසාවියේදී පරාජයට පත්වීමත් සමඟ රට තුළ ඉතා අනපේක්ෂිත හා අප්‍රසන්න දේශපාලන තත්ත්වයක් ඇති විමයි.

"2018 ඔක්තොම්බර් 26 වැනි සිකුරාදා සවස ජනාධිපති ලේකම් කායර්ාලයෙන් අමුතු නිවේදන තුනක් නිකුත් විය, එය පහත දැක්වෙන අනුපිළිවෙලින් සිදු විය: (අ) එක්සත් ජනතා නිදහස් සන්ධානය රජයෙන් ඉවත් වීමේ නිවේදනය; (ආ) මහින්ද රාජපක්ෂ මහතා අගමැති ලෙස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඉදිරියේ දිවුරුම් දීම; සහ (ඇ) 42(4) ව්‍යවස්ථාව යටතේ රනිල් වික්‍රමසිංහ මහතා අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉවත් කර ඇති බව ජනාධිපතිවරයා විසින් ලිඛිතව ඔහුට දන්වා ඇති බව නිවේදනය කිරීම". [20]

පාලර්මේන්තුවේ කිසිදු උපදේශනයකින් තොරව සම්පූණර් සැලැස්ම මුළුමනින්ම රහසිගතව සැලසුම් කර තිබූ අතර එය පිටුපස ඇති අරමුණු පිළිබඳ සංකීණර් ප්‍රශ්න කිහිපයක් ඉතිරි කරමින් රටම පුදුමයට පත් කළේය. මේ අනුව සමස්ත සිදුවීම් මාලාවම රට තුළ ව්‍යවස්ථාමය අබර්ුදයක් නිමර්ාණය කළේය.

2015 දී 19වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීමෙන් පසු අගමැති ධූරය දැරීම නැවැත්විය හැක්කේ මරණයෙන්, ඉල්ලා අස්වීමෙන්, පාලර්මේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉවත්වීමෙන් හෝ සමස්තයක් වශයෙන් ආණ්ඩුවට පාලර්මේන්තුවේ විශ්වාසය නැති වී ඇත්නම් පමණි. රාජාසන කතාව, අයවැය හෝ විශ්වාසභංගයක් පරාජය (46(2) සහ 48 වගන්ති) මගින් එය ප්‍රකාශ වේ. [21]

ව්‍යවස්ථා කුමන්ත්‍රණයට එරෙහිව විද්වතුන්, වෘත්තිකයන් සහ සිවිල් වැසියන් ඇතුළු දහස් ගණනක් ජනතාව නැගී සිටි අතර අවසානයේ වික්‍රමසිංහ මහතා නැවතත් අගමැති ධූරයට පත් විය.

*'මැදිවියේ කාන්තාවක් අතැති පෝස්ටරයක් මගින් ජනතාවගේ මනෝභාවය හොඳින් ප්‍රකාශ විය: "මා මෙතන ඉන්නේ රනිල් වෙනුවෙන් නොවෙයි. මා මෙතන ඉන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය වෙනුවෙන්.'* [22]

මෙම අයහපත් සිදුවීම් මාලාව ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර වෘත්තීය සබඳතාවයට සහ සම්බන්ධීකරණයට බලපෑ අතර එය රටේ නීතිය හා සාමය දියාරු වීමට හේතු වූ එක් සාධකයක් ලෙස සැලකිය හැකිය.

පාස්කු ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ජනතාව අතර තැතිගන්වනසුලු තත්ත්වයක් නිමර්ාණය විය. තමන් අනාරක්ෂිත බවත් තවදුරටත් විපත්වලින් ආරක්ෂා වීමට නායකයෙකු අවශ්‍ය බවත් ඔවහු සිතූහ. යුද සමයේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් වූ ගෝඨාභය රාජපක්ෂ, ඉස්ලාම් අන්තවාදය පැතිරීම නැවැත්වීමට සහ 'ජාල විනාශ කරන' බවට පොරොන්දු වෙමින් තමා ජනාධිපති ධූරයට තරඟ කරන බව විනාශකාරී ප්‍රහාරයෙන් දින 5 කට පසු අප්‍රේල් 26 වන දින නිවේදනය කළේය. [23]

ජාතික ආරක්ෂාව වෙනුවට වාගර්ික සංහිඳියාවට සහ පුද්ගල නිදහසට ප්‍රමුඛත්වය දීම සම්බන්ධයෙන් එවකට පැවති රජයට දොස් පැවරීම ඔස්සේ 2019 රාජපක්ෂ රෙජීමයේ සමස්ත ජනාධිපතිවරණ ව්‍යාපාරයම මෙහෙයවන ලදි. [24] මෙම ක්‍රියාමාලාව සහ පොරොන්දුව ඔස්සේ 2019 නොවැම්බර් මාසයේදී ගෝඨාභය රාජපක්ෂ විධායක ජනාධිපති ලෙස බලයට පත් විය. [25]

## වින්දිතයන් සහ දිවි ගලවා ගත් අය: ජීවිත අහිමි විය, අනාගතය සොරකම් කරන ලදි

පාස්කු ප්‍රහාරයෙන් විවිධ වයස්වල, ජාතීන්ට සහ ආථර්ික තත්ත්වයන්ට අයත් බොහෝ දෙනෙකුගේ ජීවිත අහිමි විය. ඉලක්කගත ස්ථාන පාස්කු ඉරිදා දේව මෙහෙයන් සඳහා ජනප්‍රිය වූ ඒවා විය. පවුලේ නිවාඩු ගත කළ පිරිස් ද ප්‍රහාරවලට ගොදුරු වීම හේතුවෙන්, මෙම ඛේදනීය තත්ත්වය විවිධ ප්‍රජාවන්ගේ වැලපීමට හේතු විය. පල්ලියේ සේවාවන්ට සහභාගී වන බොහෝ දරුවන්, [26] සංචාරකයින්, ඉහළ පෙළේ ඩෙන්මාකර් ප්‍රකෝටිපතියකු සහ 'Bestseller' හි ප්‍රධාන විධායක නිලධාරී Anders Holch Povlsenගේ දරුවන්, [27] පස් දෙනෙකුගෙන් යුත් සමස්ත පවුලක් සහ නිවාඩුවට පැමිණ සිටි JDS (ඉන්දියානු දේශපාලන පක්ෂයක්) සාමාජිකයින් හත් දෙනෙකු ප්‍රහාරයට

ගොදුරු වූ පිරිස අතර සිටියහ.[28] කෙසේ වෙතත්, විවිධ වින්දිතයින් සහ දිවි ගලවා ගත් කණ්ඩායම් වෙත බොහෝ ලිපි සහ මාධ්‍ය මගින් ආවරණය ලැබුණද, පාස්කු ප්‍රහාරයෙන් විශාල වශයෙන් පීඩාවට පත් වූ අමතක වූ ප්‍රජාවක් වන්නේ ශ්‍රී ලංකාවේ මලයහ දෙමළ ප්‍රජාවේ ජනතාවයි.

දිවයිනේ මධ්‍යම කඳුකරයේ ජීවත් වන මලයහ දෙමළ ජනතාව හෝ තේ වතු කම්කරු ප්‍රජාව අඩු නියෝජනයක් සහ හඬක් නොමැති ප්‍රජාවකි. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයන් විසින් කඳුකරයේ වතුවල වැඩ කිරීමට දකුණු ඉන්දියාවෙන් ගැහැනුන් සහ පිරිමින් ගෙන්වාගෙන වසර දෙසීයක් ගතවී ඇතත්,[29] ඔවුන්ගේ ජීවන තත්ත්වය සහ වතර්මාන තත්ත්වය එතරම් දියුණු වී නැත. වහල්භාවයේ කොටසක් ලෙස යටත් විජිතවාදය තුළ ආරම්භ වූ අරගලය සහ සමානාත්මතාවය සහ නියාමනය නොමැතිකම අද දක්වාම මෙම ප්‍රජාවගේ ජීවිතවලට බලපා ඇත. වතර්මානයේ මලයහ දෙමළ ජනයා කුලය, පංතිය, ශ්‍රම බණ්ඩනය සහ ජනවාගරීකත්වය මත පදනම් වූ සමාජ වෙනස්කම්වලට ලක්ව සිටින අතර,[30] අනෙක් අයට ලැබෙන සමාන අයිතිවාසිකම් ඔවුන්ට නොලැබේ. රැකියා සඳහා කුලියට ගැනීමට ඇති ඉඩකඩ අඩු වන අතර, අඩු වැටුප් ගෙවනු ලැබේ. ඔවුන් දේශපාලනිකව කොන් කර ඇත. ආණ්ඩුව නියෝජනය අඩුය.[31] මීට අමතරව, ශ්‍රී ලංකාව ලොව දෙවන විශාලතම තේ අපනයනකරු වුවද, එහි ඉඩම් නොමැති තේ වතු කම්කරුවන් (බොහෝ විට මලයහ ප්‍රජාව) රටේ දුප්පත්ම අය වේ.[32] තේ වතු කම්කරුවන්ගෙන් අඩකට වඩා දිනකට ඩොලර් 3.65ක දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන බව ලෝක බැංකුව නිරීක්ෂණය කර ඇත.[33]

*"ඕනෑම මිනුම් දණ්ඩක් යොදා බලන්න. ඒක පුද්ගල ආදායම, ජීවන තත්වයන්, දීසර්ායුෂ, අධ්‍යාපනික ජයග්‍රහණ සහ කාන්තාවන්ගේ තත්ත්වය වැනි මේ ඕනෑම මිනුම් දණ්ඩකට අනුව ඔවුන් සිටින්නේ ඉණිමගේ පතුලේ ය"*[34]

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පීඩාවට පත් සැලකිය යුතු සංඛ්‍යාවක්, සමාජ වෙනස් කොට සැලකීම සහ වඩාත්ම ආන්තික ප්‍රජාවන්ගෙන් එකක් වීම, ආර්ථික ගැටලු, දේශපාලනික වශයෙන් පිළිගැනීමේ දුෂ්කරතා, පුරවැසිභාවය සහ පිළිගත් අයිතිවාසිකම් පිළිබඳ අවිනිශ්චිතතාවය යන මෙම තත්වයන් තුළ ජීවත් වන මලයහ ප්‍රජාවයි.

රට මැද ප්‍රදේශවලට ප්‍රහාරයක් එල්ල නොවූවත්, කොළඹ සේවයේ නියුතු හෝ එහි ගිය මලයහ ප්‍රජාව ගෙන් සැලකිය යුතු පිරිසක් ශාන්ත අන්තෝනි කතෝලික දේවස්ථානයේ දේව මෙහෙයට සහභාගි වෙමින් සිටියහ. විනාශකාරී බෝම්බ ප්‍රහාරය හේතුවෙන් බොහෝ දෙනෙකුට තම ආදරණීයයන් අහිමි වූ අතර ඔවුන්ගෙන් ඇතැමෙක් පවුලට මූල්‍යමය දායකත්වය ලබා දුන් අය වූහ. චිත්තවේගීය අලාභයට අමතරව, මෙම ප්‍රජාවේ බොහෝ පවුල් සඳහා මූල්‍ය බර පෙර නොවූ විරූ ලෙස ඉහළ ගියේය. එබැවින් මෙමගින් විශාල උපකාර අවශ්‍යතාවයක් ද නිමර්ාණය කර තිබේ. කොළඹ අගරදගුරු පදවියේ සමාජ ක්‍රියාකාරී අංශය වන සෙත් සරණ විසින් ප්‍රහාරයෙන් විපතට පත් වූවන් සඳහා නිවාස පිරිනමන ලදි. නමුත් මේ ගෙවල් තිබුණේ කොළඹ නිසා සමහර අයට පුරුදු ජීවිතයත්, රැකියාවත් අතහැර නැවත පදිංචි වී අලුත් තැනක අලුත් ජීවිත ආරම්භ කරන්නට සිදු විය. තම ළමයින්ගේ පාසල් අධ්‍යාපනයට බාධා කළ නොහැකි නිසාත්, කොළඹ සිටින අනෙක් අයෙගේ අවශ්‍යතා සැපයීමට වියදම් අධික නිසාත් කුඩා දරුවන් ඇතුළු තම පවුලේ සාමාජිකයන් හැර යාමට දිවි ගලවා ගත් සමහර අයට සිදු විය.

*වදනිට* පවුලේ එකම ආදායම් උපදවන්නා වූ ඇගේ සැමියා පාස්කු ඉරු දින ප්‍රහාර හේතුවෙන් අහිමි විය. ඛේදවාචකය හේතුවෙන් ඇය තුන් හැවිරිදි දරුවෙකු සමඟ ජීවත් වූ රැකියා විරහිත වැන්දඹුවක් වූවාය. ස්ථිර ආදායම් මාගර්යක් නොමැතිව, ඇයගේ ඥාතීන් ඇතුළු සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුත් මුළු පවුලටම ආදායම් ඉපැයීමේ බර කරට ගැනීමට ඇයට සිදු විය. ඇයට කොළඹින් නව නිවසක් ද ලැබුණු නිසා ඇයගේ කොළඹ රැකියාවෙන් මුදල් එවනු ලැබේ. ඇගේ දරුවා දැන් ඇගේ නැන්දම්මා විසින් රැකබලා ගනු ලැබේ.*

තම දරුවන් කණගාටුදායක ලෙස අහිමි වීම නිසා මානසික රෝගවලින් පෙළෙන මවුපියන් ද සිටින අතර, ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය සහ දරුවන්ගේ අධ්‍යාපනය, ආහාර, විදුලිය වැනි අවශ්‍යතා සඳහා මුදල් ගෙවීමට ප්‍රමුඛත්වය දීම නිසා අවශ්‍ය වෛද්‍ය ආධාර ලබා ගැනීමට නොහැකිව සිටිති.

*හය දෙනෙකුගෙන් යුත් ඔහුගේ පවුලේ එකම ආහාර සැපයුම්කරු වූ කුලී කම්කරු ජෝන්ට* ඔහුගේ දියණිය (අවුරුදු 5) අහිමි විය. තම වැඩිමහල් දියණියගේ අනපේක්ෂිත වියෝව නිසා ඔහුගේ බිරිඳ මේ වන විට බයිපෝලර් තත්වයෙන් පෙළෙයි. මේ හේතුවෙන් තම දරුවන් තනිකර රැකියාවකට යාමට නොහැකිව ඔවුන්ට තමන්ගේම නවාතැනක් පවා නොමැතිව ඉතා දිළිඳු ජීවිතයක් ගත කිරීමට සිදු වී ඇත.*

මෙම ප්‍රජාවේ දිවි ගලවා ගත් සමහර අය වෛද්‍ය වියදම් දැරීමට සහ මෙම තුවාල මගින් ඔවුන්ගේ රැකියාවට සහ අනාගතයට ඇති කර ඇති බලපෑම සමඟ හැඩගැසීමට සටන් කරමින් සිටිති.

*ආකාෂ්ගේ* කන් ඇසීම දුවර්ල වීමට ප්‍රහාරය බලපෑවේය. ඔහුට ශල්‍යකමර්යක් කරන ලෙස වෛද්‍යවරුන් උපදෙස් දුන් නමුත් ඒ සඳහා රු. ලක්ෂ තුනක් වැය වන නිසාත්, එයින් පසු මාස තුනක විවේකයක් ලබා ගන්නා ලෙස ඔහුට උපදෙස් දී තිබෙන නිසාත්, ඔහුගේ ආදායම් අහිමි වීම මුළු පවුලටම බලපාන නිසා ඔහු එය කල් දැමුවේය. වාසනාවකට මෙන්, අරමුදල් සපයන්නන්ගේ සහය මත ශල්‍යකමර්ය නොමිලේ සිදු කරන ලදි. එහෙත් තවදුරටත් ගැටලු පවතින බව පෙනෙන්නට ඇති අතර වෛද්‍යවරුන් තවත් සැත්කමක් කිරීමට නියම කර ඇත. ඔහු තවමත් සුළු වේදනාවකින් පසුවන අතර පාරිභෝගිකයින් කියන දේ පැහැදිලිව ඇසීමට සහ තේරුම් ගැනීමට අපහසු නිසා ඔහු රැකියාවෙන් ඉවත් වී දැන් රැකියාවක් නොමැතිව සිටී.*

මේ පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූ අහිංසක ජීවිත රැසක කතාන්දර අතරින් කිහිපයක් පමණි. ජීවිත විනාශ වී අනාගතය විනාශ වී ඇති බැවින් විශාල හා ස්ථිර බලපෑමක් සිදු වී තිබේ. මේ වන විට ඔවුන්ගෙන් බහුතරයක් මුළු රටම මුහුණ දී සිටින නමුත් විශේෂයෙන් මලයහ ප්‍රජාව මහත් අසීරුවේන් මුහුණ දෙන ආථර්ික අබර්ුදයට සහ මූල්‍ය අරගල මැද තම ජීවිතය නැවත ගොඩනගා ගැනීමේ ක්‍රියාවලියේද සිටිති.

## සමාජ-සංස්කෘතික බලපෑම: අධි ආතතිය

ප්‍රහාරයෙන් ඉක්බිතිව, ශ්‍රී ලංකා රජය සියලු සමාජ මාධ්‍ය වෙබ් අඩවිවලට ප්‍රවේශ වීම අවහිර කළේය, දින දෙකක් පාසල් වසා දමා, දිවයින පුරා පැය 12 ක ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කළේය. විමශර්න දිගටම කරගෙන යන අතරවාරයේ කොළඹ සහ අනෙකුත් ප්‍රදේශ අවට ආරක්ෂක පියවර දැඩි කළේය. මෙම තත්ත්වය පිළිබඳව ෆේස්බුක් ආයතනය නිවේදනයක් නිකුත් කරමින් මෙසේ කියා සිටියේය.

"Facebook ආයතනයේ කණ්ඩායම් පළමු ප්‍රතිචාර දක්වන්නන්ට සහ නීතිය බලාත්මක කරන්නන්ට උපකාර කරමින් සිටින අතර අපගේ ප්‍රමිතීන් උල්ලංඝනය කරන අන්තගර්තයන් හඳුනා ගැනීමට සහ ඉවත් කිරීමට ද කටයුතු කරමින් සිටිති." [35]

පාස්කු ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ව රටේ සාමාන්‍ය ජනතාව විසින් ඔවුන්ගේ වාගර්ික හා ආගමික අනන්‍යතාවය මත හඳුනා ගන්නා ලද අතර මෙය වාගර්ික හා ආගමික සහජීවනයට බරපතළ හානි සිදු කළේය. මෙම සිද්ධිය පිටුපස ඇති වාගර්ික හා ආගමික න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මාධ්‍ය විසින් ඉටු කරන ලද කායර්භාරය හේතුවෙන් මෙය තවත් තීව්‍ර විය.[36] එහි ප්‍රතිඵලයක් ලෙස ආගමික කණ්ඩායම් සහ ජනවාගර්ික කණ්ඩායම් අතර විශ්වාසය බිඳ වැටිණි. මුස්ලිම් ප්‍රජාව ත්‍රස්තවාදීන් ලෙස සැක කර කොන් කරන ලදි. සමස්ත මුස්ලිම් ප්‍රජාව කෙරෙහිම පොදු වෛරයක් වධර්නය විය. ගම් මට්ටමින් මුස්ලිම් ව්‍යාපාර ප්‍රතික්ෂේප කිරීම රට තුළ ඇති වූ විශාල සමාජ සංස්කෘතික කම්පනයේ සුළු පිළිබිඹුවක් ලෙස දැක්විය හැකිය.[37]

'මහජන කෝපය ජාතියේ මිලියන දෙකකට ආසන්න මුස්ලිම්වරුන් කෙරෙහි යොමු වී ඇත.'[38]

රටේ විවිධ ප්‍රදේශවල පල්ලි සහ මුස්ලිම්වරුන්ට අයත් කඩ සාප්පු රැසක් විනාශ කර, ගිනි තබා විනාශ කරන ලදි. මැර පිරිසක් තම ව්‍යාපාරයට පහර දීමෙන් පසු, පිහි ඇනුමකින් පුත්තලමේ පුද්ගලයකු මියයාමත් සමඟ බොහෝ මුස්ලිම්වරුන්ට තමන් වෛරයේ ඉලක්ක වී ඇති බව හැඟී ගියේය.[39] මුස්ලිම් කඩවලින් මිල දී නොගන්නා ලෙස ජ්‍යෙෂ්ඨ බෞද්ධ භික්ෂුවක් සිංහල ජනතාවගෙන් ප්‍රසිද්ධියේ ඉල්ලා සිටීම නිසා ජූනි මාසයේදී පවා දැඩි ආතතියක් ඇති විය.[40] නොසන්සුන්කාරී තත්වය සහ කෝලාහල මුස්ලිම් ප්‍රජාවගේ ආතතියට හා කැළඹීමට හේතු වූ අතර, සිංහල බහුතරයක් සිටින ආරක්ෂක අංශ ද මෙයට හවුල් වී ඇති බවත්, මැර කණ්ඩායම් වැළැක්වීමට ප්‍රමාණවත් ලෙස මැදිහත් නොවූ බවත් ඔවුහු චෝදනා කළහ.[41] බොහෝ ආගමික සහ දේශපාලන නායකයින් පුරවැසියන්ගෙන් සන්සුන්ව සිටින ලෙසත් අන්තජර්ාලය හරහා අසත්‍ය තොරතුරු නොපතුරුවන ලෙසත් ඉල්ලා සිටියද, සමාජ මාධ්‍ය අවහිර නොතකා කටකතා සහ භීතිය සමාජ මාධ්‍ය හරහා සංසරණය විය. කිසිදු සාක්ෂියක් නොතිබුණත්, සිංහල කාන්තාවන් රහසිගතව වන්ධ්‍යාකරණය කළ බවට මුස්ලිම් වෛද්‍යවරයකු අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම දක්වා වාගර්ික වෛරය වධර්නය විය.[42] මීට අමතරව, පුද්ගලයන්ට තම අනන්‍යතාවය සඟවා ගැනීම වැළැක්වීම

සඳහා ජනාධිපතිවරයා සියලු ආකාරයේ මුහුණු ආවරණ තහනම් කළේය.[43] මුස්ලිම් කාන්තාවන් පළඳින පදර්ාව එහි නිශ්චිතව නම් කර නැතත්, මෙම තහනම හමුවේ මුස්ලිම් කාන්තාවන්ට හිරිහැර සිදු වූ ආකාරය විවිධ අයිතිවාසිකම් කණ්ඩායම් විසින් ප්‍රසිද්ධ කර ඇත.[44] මේ සියලු ප්‍රශ්න නිසා රාජ්‍යයට හමුදා බලය වැඩි කිරීමටත් ආරක්ෂක විධිවිධාන දැඩි කිරීමටත් සිදු විය. රටේ වාගර්ික ආතතිය යළිත් වරක් ඉහළ ගියේය. තම රටවල තාඩන පීඩනවලින් බේරීම සඳහා තාවකාලික රැකවරණ පතා සිටි සරණාගතයින් සහ දේශපාලන රැකවරණ සොයන්නන් "අන්තවාදී මුස්ලිම්වරුන්" යැයි සැක කළ බැවින් ඔවුන් ද සතුරුකම් හා ප්‍රහාරවලට ද ලක් විය. බොහෝ අය තම නිවෙස්වලින් නෙරපා හරින ලද අතර කම්පන සහගත හා නින්දිත අත්දැකීම්වලට මුහුණ දුන්හ.[45]

## අනථර්කාරී ආථර්ික ප්‍රතිවිපාක

ශ්‍රී ලංකාවේ විශාලතම කමර්ාන්ත සහ ආදායම් මාගර්වලින් එකක් වන්නේ සංචාරක අංශයයි.[46] එය විදේශ ආයෝජන සඳහා ප්‍රධාන අංශයක් ද වේ. 2018 දී Lonely Planet විසින් 2019 වසරේ සංචාරය කිරීමට ලෝකයේ හොඳම රට ලෙස ශ්‍රී ලංකාව නම් කරන ලද අතර එය සංචාරක ව්‍යාපාරයෙන් පමණක් රටට උපයා ගත හැකිව තිබුණු ආදායම පෙන්නුම් කරයි.[47] කෙසේ වෙතත්, පාස්කු ඉරිදා ප්‍රහාරයේ බලපෑම මෙම කමර්ාන්තයට ඛේදජනක ආකාරයෙන් බලපෑවේය.

2019 සංචාරක බලධාරීන් විසින් ඇස්තමේන්තු කරන ලද පරිදි ශ්‍රී ලංකාවට වාතර්ා සහගත අන්දමින් සංචාරකයින් මිලියන 2.5ක් පැමිණීමට අවස්ථාව තිබිණි.[48] කෙසේ වෙතත්, ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය ඇතුළු රටවල් 37කට ආසන්න සංඛ්‍යාවක් ත්‍රස්තවාදය සහ වැඩි වූ ආතතිය හේතුවෙන් ශ්‍රී ලංකාව පිළිබඳ සංචාරක අනතුරු ඇඟවීම් (තාවකාලික) නිකුත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ සංචාරක කමර්ාන්තයට විශාල පහරක් එල්ල විය.[49] වසර ආරම්භයේදී දිවයිනට විශාල අමුත්තන් සංඛ්‍යාවක් (දිනකට සාමාන්‍යයෙන් සංචාරකයින් 7,600ක්) පැමිණියද, අප්‍රේල් ප්‍රහාරයෙන් පසුව මෙය කනගාටුදායක ලෙස (දිනකට සංචාරකයින් 1,700ක්) අඩු විය.[50] 2019 වසරේ ශ්‍රී ලංකාවට පැමිණ ඇත්තේ සංචාරකයින් මිලියන 1.9 ක් පමණක් වන අතර එය පෙර වසරේ පැමිණි මිලියන 2.3 ට වඩා 18% ක අඩුවීමකි.[51] සංචාරක ඉපැයීම් 17.7%කින් පහත වැටීමට එම තත්වය හේතු විය.[52]

ශ්‍රී ලංකාවේ සංචාරක කමර්ාන්තයෙහි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සංගමය (ASMET) පවසන පරිදි, බොහෝ ව්‍යාපාර අලාභයන්ට මුහුණ දුන් බැවින් ඔවුන්ගේ කායර් මණ්ඩලවල සේවය අත්හිටුවීම හෝ අඩු කිරීම සිදු කර ඇත.[53] සංචාරක ව්‍යාපාරය අවදානම් සහ අස්ථාවර කමර්ාන්තයක් ලෙස සලකනු ලබන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, දැඩි ශ්‍රම හිඟය සහ පුහුණු ශ්‍රමිකයන් නොමැතිකම හේතුවෙන් කමර්ාන්තයට දිගු කාලීනව බලපෑම් ඇති විය. ශ්‍රමිකයන් එයට සම්බන්ධ වීමට අකැමැත්තක් නිමර්ාණය විය.[54] එය ප්‍රධාන වශයෙන් සංචාරක ව්‍යාපාරයට බලපෑවද, ගුවන් ප්‍රවාහන සේවා, දේශීය ප්‍රවාහනය, තොග සහ සිල්ලර වෙළෙඳාම සහ නවාතැන් පහසුකම්, ආහාර පාන සේවා ක්‍රියාකාරකම්, විවේකය සහ විනෝදාස්වාදය සහ කෘෂිකමර්ාන්තය වැනි තවත් අංශ කිහිපයකට ද එහි බලපෑම ව්‍යාප්ත විය.[55]

එහි ප්‍රතිඵලයක් වශයෙන්, විදේශ ආයෝජන ඉවත් කර ගැනීම සහ රට ධනාත්මකව ප්‍රකාශයට පත් නොවීම නිසා, ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකා රුපියල ද යම් පීඩනයකට මුහුණ දුන්නේය.[56] මීට අමතරව, කොළඹ කොටස් වෙළෙඳපොළ මිල දශර්ක පහත වැටීම සහ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය ද පසුබෑමකට ලක්විය. මූල්‍ය කායර් සාධනය පිරිහී, සහන පැකේජ සඳහා මූල්‍යකරණය සහ ආරක්ෂක පියවරයන් ශක්තිමත් කිරීම හේතුවෙන් රජයේ වියදම් ඉහළ ගියේය.[57] එබැවින්, 2019 දී රටේ ආථර්ික අරගල සඳහා වෙනත් සාධක දායක වුවා මෙන්ම පාස්කු ප්‍රහාරයෙන්ද විනාශකාරී දායකත්වයක් ජාතික ආදායම අඩු වීම, රැකියා අංශය පීඩනයට ලක්වීම, ඉහළ විනිමය අනුපාත සහ ඉහළ වියදම් ආදියට සිදු කර ඇති බව පැහැදිලිය.

# නීතිමය ඉදිරි දැක්ම: ගොනු කර ඇති නඩු

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් අපරාධ නඩු කිහිපයක් ගොනු කර තිබේ. අපරාධ නඩු සම්බන්ධයෙන් පමණක් සළකා බලන විට, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් ගොනු කර ඇති සංඛ්‍යාව 40කට අධිකය (විස්තරාත්මක ලැයිස්තුවක් සඳහා ඇමුණුම 1 සහ 2 බලන්න). පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට සෘජුවම සම්බන්ධ වීම, ප්‍රහාරයට ආධාර අනුබල දීම, ප්‍රහාර වැලැක්වීමට අපොහොසත් වීම හෝ අන්තවාදී අදහස් හා මත ප්‍රචාරය කිරීම හරහා වක්‍රව එවැනි සිදුවීමක් ඇති කිරීමට සම්බන්ධ වීම මෙම නඩුවලට සම්බන්ධ විත්තිකරුවන්ට එල්ල වන චෝදනාවන් වේ. කෙසේ වෙතත්, බොහෝ නඩු සඳහා තවමත් අධිකරණමය තීන්දුවක් ලැබී නොමැත. එම නඩු තවමත් විභාග වෙමින් පවතී. වැදගත් නඩු තීන්දු කිහිපයක ප්‍රගතිය පහතින් සාකච්ඡා කෙරේ. 'ප්‍රධාන පාස්කු ප්‍රහාර නඩු 11 හි විශේෂ අවස්ථා' යන මාතෘකාව යටතේ සමාජය සහ සාමයික කේන්ද්‍රය විසින් මීට පෙර නිකුත් කරන ලද වාතර්ාවකින් මෙම නඩු වල ආරම්භක අදියර පිළිබඳ විස්තර සොයාගත හැකිය.

## 1. *පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා ලැබූ පුද්ගලයන් 25 දෙනෙකුට එරෙහි ප්‍රධාන අපරාධ නඩුව- HC (TAB) 2972/21*

2019 අප්‍රේල් 21 වැනිදා සිදුවූ සියලුම බෝම්බ පිපිරීම් සම්බන්ධයෙන් නවුෆර් මවුලවි ඇතුළු විත්තිකරුවන් 25 දෙනකුට එරෙහි නඩු අංක HC (TAB) 2972 යටතේ පවරා තිබෙන අපරාධ නඩුව පාස්කු ඉරිදා ප්‍රහාරයට අදාළව දැනට පවතින ප්‍රධාන අපරාධ නඩුව වේ. මෙම නඩුවේදී, ප්‍රහාරයට කුමන්ත්‍රණය කිරීම, ආධාර කිරීම සහ අනුබල දීම ඇතුළු චෝදනා 23,270ක් අඩංගු අධිචෝදනා 2022 ජනවාරි 12 වන දින ගොනුකරනු ලැබීය.[58] 17වැනි විත්තිකරු බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී අභාවප්‍රාප්ත වීමත් සමඟ දැනට විත්තිකරුවන් 24දෙනෙකුට එරෙහිව නඩුව විභාග වෙමින් පවතී. දෙමළ කතා කරන නීතිඥවරුන් නොමැතිකම, අධි චෝදනා පත්‍රවල දෙමළ පරිවතර්න නොමැතිකම වැනි විවිධ හේතු නිසා නඩු විභාගය ප්‍රමාද වූ අතර අවසානයේ 2023 ඔක්තෝම්බර් 10 වැනි දින මුලින්ම නඩුව විභාගයට ගන්නා ලදි.[59] නඩු විභාගය ආරම්භ කිරීමට මෙතරම් කාලයක් ගත වූයේ මන්දැයි යන්න තීරණාත්මක ප්‍රශ්නයකි. කෙසේ වෙතත්, විත්තිකාර පාශර්වය බෝම්බ පිපිරීම් සිදුවූ බව පිළිනොගැනීම නිසා දින 44 පුරාවටම පැමිණිල්ලට සාක්ෂිකරුවන් කැඳවා පාස්කු ඉරිදා බෝම්බ පිපිරීම් සිදු කළ මරාගෙන මැරෙන බෝම්බකරුවන් සිටි බව තහවුරු කිරීමට සිදු විය.

2025 පෙබරවාරි 13 වන දින, නඩු විභාගය සිදු වූ 102 වන දින වේ. 11 වැනි විත්තිකරු විසින් කරන ලද පාපොච්චාරණයන් දෙකක් පැමිණිල්ල විසින් සාක්ෂි ලෙස භාවිතා කරයි. මෙම පාපොච්චාරණ මඟින් අනෙකුත් විත්තිකරුවන්ට චෝදනා එල්ල විය හැකි බැවින්, මෙම නඩුවේ ප්‍රධාන අංගයක් වන මෙම පාපොච්චාරණ ස්වේච්ඡාවෙන් ලබා දුන්නේද යන්න තක්සේරු කිරීම සඳහා බරපතල පරීක්ෂණ 2 ක් පවතී.

| |
|---|
| නඩු අංකය: HC (TAB) 2972/21<br>චූදිතයන්: නවුෆර් මවුලවි සහ තවත් 23 දෙනෙක්<br>අධිකරණය: කොළඹ මහාධිකරණය<br>ඊළඟ දිනය: 2025 මාතර්ු 12<br>වත්මන් තත්ත්වය: විභාගය සිදුවෙමින් පවතී |

## 2. පාස්කු ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම්වරයාට සහ හිටපු පොලිස්පතිවරයාට එරෙහි නඩුව – HC/TAB/2899/21 සහ HC/TAB/2900/21

| |
|---|
| නඩු අංක: HC/TAB/2900/21 සහ S.C.TAB No. 03/23<br>චූදිත: පූජිත් ජයසුන්දර<br>අධිකරණය: කොළඹ මහාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය<br>වත්මන තත්වය: විත්තියේ නඩුව ආරම්භ වන තුරු බලා සිටී. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මෙතැනින් ලබා ගත |

| |
|---|
| නඩු අංක: HC/TAB/2899/21 සහ S.C. TAB No. 02/23<br>චූදිත: හේමසිරි ප්‍රනාන්දු<br>අධිකරණය: කොළඹ මහාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය<br>වත්මන තත්වය: විත්තියේ නඩුව ආරම්භ වන තුරු බලා සිටී. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මෙතැනින් ලබා ගත |

2021 වසරේ පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සහ රාජකාරි පැහැර හැරීම (ඇතුළු චෝදනා) සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාට අධිචෝදනා ගොනු කරන ලදි. මෙම නඩු කොළඹ මහාධිකරණයේ වෙන වෙනම නඩු විභාගයන් දෙකකදී විභාගයට ගැනුණු අතර, විත්තිකරුවන් දෙදෙනාම 2022 පෙබරවාරි 18වන දින විත්ති පාශර්වයෙන් සාක්ෂි කැඳවීමකින් තොරව අධිකරණය විසින් නිදොස් කොට නිදහස් කරන ලදි.[60] මේ සෑම නඩුවකටම චෝදනා 855ක් තිබුණද සැබෑ ප්‍රශ්නය වූයේ දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය අනුව අනුබල දීමක් තිබේද යන්නයි. අනුබල දෙන්නකු ලෙස අර්ථ දැක්වෙන්නේ "ඕනෑම ක්‍රියාවකින් හෝ නීති විරෝධී අතපසුවීමකින්, එම දෙය කිරීමට හිතාමතාම ආධාර කරන" අයෙකි. විනිසුරු මඩුල්ලේ ස්ථාවරය වූයේ ඔවුන් අතපසු කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් ලෙස සැලකිය හැකි බවට ඔප්පු කිරීමට බලගතු සහ සාධාරණ සාක්ෂි නොමැති බවයි.[61] සෑම නඩුවකටම සාක්ෂිකරුවන් 1200ක් පමණ නම් කර තිබුණද, නඩු විභාගයේදී සාක්ෂි දීමට කැඳවා තිබුණේ සාක්ෂිකරුවන් 6-7ක් පමණ වන ඉතා සුළු සංඛ්‍යාවකි.[62]

මෙම නඩු දෙකම සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් නඩු අංක S.C. TAB අංක 02/23 සහ S.C.TAB අංක 03/23 සමග ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා ඉදිරිපත් කර තිබේ. 2023 ජූලි 4 වැනිදා සිට පංච පුද්ගල විනිසුරු මඩුල්ලක් හමුවේ නඩු විභාගයට ගැනිණි. 2023 සැප්තැම්බර් 8 වැනි දින නඩු විභාගය අවසන් වූ අතර, 2022 පෙබරවාරි 18 වැනි දින නඩු විභාගයෙන් නිකුත් කළ නියෝගය අවලංගු කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු තීරණය කළහ. විත්තිකාර පාශර්වයට කරුණු දැක්වීම සඳහා නඩුව විභාගයට තැබිය යුතු බවට ද ඔවුහු තීන්දු කළහ. සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමේ භාරය යොදා ගනිමින් විත්තිකරුගේ වරද තීරණය කිරීම සඳහා සියලු සාක්ෂි ප්‍රවේශමෙන් නැවත ඇගයීමට අධිකරණය බැඳී සිටී. වරද තීරණය කළ යුත්තේ නඩු විභාගය අවසන් වූ පසුවය. විත්තිකරුවන්ට විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලෙසත් ඉතිරි නඩු කටයුතු කරගෙන යන ලෙසත් ඉල්ලා සිටිමින් නඩු විභාගය ඉදිරියට ගෙන යන ලෙස මහාධිකරණ විනිසුරුවන්ට නියෝග කළේය.

## 3. පාස්කු ප්‍රහාරවලට අදාළ මූලික අයිතිවාසිකම් නඩු – SC FR 163/2019, SC FR 165/2019, SC FR 166/2019, SCFR 184/2019, SCFR 188/2019, SC/F2019, SC/9191 /2019, SC FR 195/2019, SC FR 196/2019, SC FR NO. 197/19, SC FR 198/2019, SCFR 293/2019

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර වැළැක්වීමට අසමත් වූ පුද්ගලයන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් 12ක් ගොනු කර තිබේ. 2023 ජනවාරි 12 වැනි දින, පෙත්සම්කරුවන් විසින් ගොනු කරන ලද ඉහත සඳහන් සියලු පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුව ප්‍රකාශයට පත් කළේය.[63] මූලික අයිතිවාසිකම් පෙත්සම්වල නම් කර ඇති වගඋත්තරකරුවන්ට ආසන්න ප්‍රහාරයක් පිළිබඳ විශ්වසනීය තොරතුරු තිබියදීත් පාස්කු ඉරිදා ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වූ බවත් එමඟින් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය. 2019 පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ට වන්දි ගෙවීම සඳහා මෙම සියලු අරමුදල්

එක්රැස් කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේය. විපතට පත් වූවන්ට වන්දි ලබාදීමට අවශ්‍ය පියවර රජය විසින් ගත යුතු බවට අධිකරණය නියෝග කළේය. වසර 2 කට පමණ පසු, සියලුම වගඋත්තරකරුවන් විසින් සම්පූර්ණ මුදල ගෙවා ඇත.

| වගඋත්තරකරුවන් | ගෙවීමට නියම කළ මුදල |
|---|---|
| රජය | රු. මිලියන 1 ක් |
| හේමසිරි ප්‍රනාන්දු මහතා | රු. මිලියන 50 කි |
| පූජිත් ජයසුන්දර මහතා | රු. මිලියන 75 කි |
| ගරු. මෛත්‍රීපාල සිරිසේන | රු. මිලියන 100 කි |
| සිසිර මෙන්ඩිස් මහතා | රු. මිලියන 10 |
| නිලන්ත ජයවධර්න මහතා | රු. මිලියන 75 කි |
| එකතුව | රු. මිලියන 311 කි |

මූලාශ්‍රය- https://reparations.gov.lk/

මීට අමතරව හිටපු රාජ්‍ය බුද්ධි සේවා ප්‍රධානී නිලන්ත ජයවධර්නට එරෙහිව මාස 6ක් ඇතුළත විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කළේය. විපතට පත්වූවන්ට වන්දි ලබාදීමේ ප්‍රගතිය සහ හිටපු රාජ්‍ය බුද්ධි සේවා ප්‍රධානී නිලන්ත ජයවධර්නට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව අධීක්ෂණය කර අධිකරණයට වාර්තා කරන ලෙස නීතිපතිවරයාට නියෝග කරන ලදි. තීන්දුවට අනුකූල වීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග reparations.gov.lk වෙබ් අඩවියෙන් සොයාගත හැකිය.[64]

ඉහත නඩු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නියෝගවලට අනුකූලව කටයුතු කිරීම සඳහා හානිපූර්ණ කාර්යාලය විසින් මේ අනුව ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. '2019 අප්‍රේල් පාස්කු ප්‍රහාරය – වින්දිත අරමුදල[65]' යන නාමය යටතේ ලංකා බැංකුවේ (BOC) රාජගිරිය ශාඛාවේ ගිණුම් අංක 0090167960හි 2023 ජනවාරි 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි වින්දිත අරමුදලක් පිහිටුවීම ප්‍රධාන ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. අරමුදලින් මුදල් ලබා දීම සම්බන්ධයෙන් වැඩිදුර විස්තර 'හානිපූර්ණයන්' යන කොටසින් විශ්ලේෂණය කෙරේ.

4. <u>හෙජාස් හිස්බුල්ලා සහ වෙනත් අයට එරෙහි නඩුව- HC 78/2021</u>

| |
|---|
| නඩු අංකය: HC 78/2021 |
| චූදිතයන්: හිජාස් හිස්බුල්ලා සහ මොහොමඩ් ෂකීල් |
| අධිකරණය: පුත්තලම මහාධිකරණය |
| ඊළඟ දිනය: 2025 මැයි 2 සහ 9 |
| වත්මන් තත්ත්වය: විභාගය සිදුවෙමින් පවතී |

පාස්කු ප්‍රහාරයේ බෝම්බ ප්‍රහාරකයකු සමඟ සබඳතා පැවැත්වූ සේව් ද පලර්ස් පුණ්‍යායතනයට සම්බන්ධ බවට චෝදනා එල්ල වූ නීතිඥ හිජාස් හිස්බුල්ලාට එරෙහිව මෙම නඩුව පවරා තිබේ. කෙසේ වෙතත්, හෙජාස්ට එරෙහි සාක්ෂි දුවර්ල ය. ඔහු අත්අඩංගුවට ගැනීම අත්තනෝමතික ලෙස, නිසි ක්‍රියා පටිපාටියකින් තොරව සහ නියෝග සහ ආචාර ධමර් උල්ලංඝනය වන අන්දමින් සිදු කිරීම පුළුල් ලෙස හෙළා දැකීමට ලක්ව තිබේ. හෙජාස්ට බොරු චෝදනා එල්ල කර ඇති නිසා සහ ඔහු කිසිදු ත්‍රස්තවාදී ක්‍රියාවකට සම්බන්ධ බවට අධිකරණයේ සාක්ෂි නොමැති නිසා ඔහු නිදහස් කරන ලෙස සංවිධාන 23ක් සහ පුද්ගලයින් 75ක් ඉල්ලා සිටියහ.[66] 2023 ඔක්තෝබර් 9 වන දින, පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවට (CID) සහ මහාධිකරණයට ඔහු කළ පෙර ප්‍රකාශ ගොතන ලද ඒවා බවත්, ඔහු බොරු කී බවත් පිළිගැනීම සමඟ නඩුව සැලකිය යුතු හැරවුමක් ගත්තේය.[67] 2024 ජනවාරි 16වැනි දින හිස්බුල්ලා මහතාට සහයෝගීතාවය පෙන්වීමට කතෝලික පූජකවරුන් උසාවියට පැමිණියහ. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ චූදිතයෙකු ලෙස හිස්බුල්ලා මහතාට අධිචෝදනා පවරමින් නඩු පැවරීමේදී නඩු පවරන්නන්ගේ ක්‍රියාකලාපය ගැන කතෝලික සභාව දැඩි ලෙස සැක කරන බව ප්‍රකාශ කරන ලදි.[68] කෙසේ වෙතත්, මෙම කාරණා නොතකා, නඩු විභාගය සිදුවෙමින් පවතින අතර, මෙම නඩුව 2024 මැයි 17 වන දින වැඩිදුර විභාගය සඳහා කැඳවනු ලැබේ.

5. <u>හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට එරෙහි පෞද්ගලික පැමිණිල්ල- 23084/22</u>

මෙම නඩුව 2022 සැප්තැම්බර් 16 වැනි දින හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයට ගොනු කර තිබූ පෞද්ගලික පැමිණිල්ලක් සම්බන්ධයෙන්ය.[69]සහරාන් හෂීම් සහ ඔහුගේ අනුගාමිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා ත්‍රිවිධ හමුදාව සහ/හෝ පොලිසිය යොමු කිරීමට අපොහොසත් වීම සහ/හෝ සෝදිසි කිරීම් සිදු නොකිරීම සහ/හෝ පාස්කු ප්‍රහාරයේදී සිදු වූ හානි සහ මරණ වැළැක්වීමට අපොහොසත් වීම සහ ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ඔහුගේ නීත්‍යානුකූල රාජකාරි ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් විත්තිකරුට එරෙහිව චෝදනා නගා ඇත. [70] 2022 සැප්තැම්බර් 16 වැනි දින මහේස්ත්‍රාත් අධිකරණය සිතාසි නිකුත් කරන ලද්දේ නොසැලකිල්ලෙන් මරණයට පත් කිරීම සහ/හෝ බරපතළ තුවාල සිදුකිරීම යන දණ්ඩ නීති සංග්‍රහයේ වරද

| |
|---|
| නඩු අංකය: 23084/22 |
| චූදිත: මෛත්‍රීපාල සිරිසේන (හිටපු ජනාධිපති) |
| අධිකරණය: කොටුව මහේස්ත්‍රාත් අධිකරණය |
| වත්මන් තත්ත්වය: රිට් නඩුවේ නියෝගය තෙක් රඳවා තබා ඇත |

සම්බන්ධයෙන් වූ චෝදනාව යටතේය. අවසාන නඩු දිනය 2023 මාතර්ු 17 වන දින වන අතර එය රිට් නඩුවේ නියෝගය දක්වා දැනට අත්හිටුවා ඇත.

| |
|---|
| නඩු අංකය: WRIT 354/22<br>වගඋත්තරකරුවන්: ගරු මහේස්ත්‍රාත්වරයා සහ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්<br>අධිකරණය: කොළඹ අභියාචනාධිකරණය |

6. <u>මාවනැල්ල බුද්ධ ප්‍රතිමා විනාශ කිරීමේ නඩුව- TAB 4485/21</u>

2018 දෙසැම්බර් 23 සිට 26 දක්වා කාලය තුළ මාවනැල්ල අවට බුදු පිළිමවලට හානි කිරීම සම්බන්ධයෙන් මොවුන් අත්අඩංගුවට ගත් නමුත් එම විනාශය පිටුපස සිටි මහ මොළකරු ඒ වන විට හඳුනාගෙන නොතිබුණි. එම මහමොළකරු පාස්කු ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගෙන් කෙනෙකු වූ සහරාන් හෂීම් බව පසුව අනාවරණය විය.[71] 2022 ජුනි 17 වැනි දින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ ගොනු කර ඇති අධිචෝදනා 18ක් යටතේ විත්තිකරුවන් 16දෙනෙකුට එරෙහිව මෙම නඩුව කැඳවනු ලැබීය.[72] නීත්‍යානුකූල නියෝජනයක් නොමැතිකම, විත්තිකරු අධිකරණයට නොපැමිණීම සහ විනිසුරුවරයා නිවාඩුවට යාම හේතුවෙන් අධිකරණ කටයුතු

| |
|---|
| නඩු අංකය: TAB 4485/21<br>චූදිතයන්: පුද්ගලයන් 16 දෙනෙක්<br>අධිකරණය: කෑගල්ල මහාධිකරණය<br>වත්මන් තත්ත්වය: නඩුව අවසන් |

ප්‍රමාදයන් රැසක් සිදු විය. කෙසේ වෙතත්, 2023 ජනවාරි 18 වන දින, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ චෝදනා දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඇති වැරදි බවට අඩු කිරීමෙන් පසු සියලු විත්තිකරුවන් වරද පිළිගෙන අත්හිටවූ සිර දඬුවම් ලබා ගෙන නඩුව අවසන් විය.[73]

7. <u>වනාතවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරණ ද්‍රව්‍ය නඩුව- පුත්තලම/TAB/107/2021</u>

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට අදාළව වනාතවිල්ලුව ප්‍රදේශයෙන් සොයාගත් පුහුණු කඳවුරක් සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් විත්තිකරුවන් හයදෙනෙකුට එරෙහිව මෙම නඩුව පවරා ඇත. සියදිවි නසාගැනීම් සහ ප්‍රහාරක

| |
|---|
| නඩු අංකය: පුත්තලම/TAB/107/2021<br>චූදිතයන්: පුද්ගලයන් 6 දෙනෙක්<br>අධිකරණය: පුත්තලම මහාධිකරණය<br>ඊළඟ දිනය: 2025 මාතර්‍ු 18<br>වත්මන් තත්ත්‍වය: වැඩිදුර Voir Dire විමසුම |

කණ්ඩායම් දෙකක් පුහුණු කිරීම සඳහා මෙම කඳවුර පිහිටුවා ඇති බවත් දැනගත් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ නිලධාරීන් විසින් 2019 ජනවාරි 16 වන දින මෙම පුහුණු කඳවුර සොයා ගන්නා ලදි.[74] සහරාන් සමඟ ඇති සම්බන්ධය සහ පුපුරණ ද්‍රව්‍ය වෙත සහරාන්ට ප්‍රවේශ විය හැකි වී නම් වඩා විශාල සංහාරයකට අවස්ථාව තිබිණි. මෙම නඩුවේ නඩු විභාගය ආරම්භ වී ඇති අතර තුන්වන විත්තිකරුගේ පාපොච්චාරණය සම්බන්ධයෙන් පාපොච්චාරණය ස්වේච්ඡාවෙන් ලබාදුන්නේද, නැතිනම් බලහත්කාරයෙන් (voir dire enquiry) ලබා ගත්තේද යන්න පරීක්ෂා කිරීමට නියමිතයි.

8. <u>අහ්නාෆ් ජසීම්ට එරෙහි නඩුව- HC 148/2021</u>

තරුණ කවියෙකු වන අහනාෆ් ජෙසීම්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ මෙම නඩුව පවරා ඇත්තේ ඔහුගේ 'නවරසම්' කෘතිය අන්තවාදී මත දරන බවට චෝදනා මත ය.[75] ඇප ලබා දීමට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වසර එකහමාරකට වැඩි කාලයක් අහ්නාෆ් ජෙසීම් රඳවා තබා ගෙන සිටියේය.[76] රැඳවුම් කාලය පුරාවට, ඔහුට නීතීඥයින් වෙත අර්ථවත් ප්‍රවේශය ප්‍රතික්ෂේප කරන ලද අතර, එහි අන්තගර්තය කියවා තේරුම් ගැනීමට අවස්ථාවක් ලබා නොදී ප්‍රකාශයකට අත්සන් කිරීමට බල කර ඇත.[77] අහ්නාෆ්ට සාධාරණ නඩු විභාගයක්, නියමිත ක්‍රියාවලියක් සහ නීති උපදෙස් සඳහා අසීමිත ප්‍රවේශයක් ප්‍රතික්ෂේප කරන ලද අතර ඉතා අපිරිසිදු තත්වයන් යටතේ රඳවා තබා ගැනීම නිසා මේ පිළිබඳව ජාත්‍යන්තර සැලකිල්ලක් ඇති විය.[78] පූවර් නඩු විභාගය 2022 නොවැම්බර් 16 වන දින ආරම්භ වූ අතර 2023 දෙසැම්බර් 12 වන දින පැමිණිල්ලේ සාක්ෂිකරුවන් පස් දෙනෙකුගේ සාක්ෂි විමසීමෙන් පසු සාක්ෂි නොමැතිකම හේතුවෙන් අහ්නාෆ් ජෙසීම් මහතා නිදොස් කොට නිදහස් කිරීමට අධිකරණය නියෝග කළේය.

| |
|---|
| නඩු අංකය: HC 148/2021 |
| විත්තිකරු: අහ්නාෆ් ජෙසීම් |
| අධිකරණය: පුත්තලම මහාධිකරණය |
| වත්මන් තත්ත්වය: නඩුව අවසන් |

9. <u>පාස්කු ප්‍රහාරයෙන් සිදුවූ හානි අයකර ගැනීමේ නඩුව- 16235/MR</u>

විත්තිකරුවන් 6 දෙනෙකුට එරෙහිව මීගමුව දිසා අධිකරණයේදී මෙම නඩුව 2022 දෙසැම්බර් 15 වැනි දින කැඳවන ලදි. දැනට, එය පූවර් නඩු විභාග අදියරවල පවතී.

| |
|---|
| නඩු අංකය: 16235 එම් |
| විත්තිකරුවන්: මෛත්‍රීපාල සිරිසේන, ජනාධිපති රනිල් වික්‍රමසිංහ, හේමසිරි ප්‍රනාන්දු, පූජිත් ජයසුන්දර, නිලන්ත ජයවධර්න සහ නීතිපති |
| අධිකරණය: මීගමුව දිසා අධිකරණය |
| ඊළඟ දිනය: 2025 අප්‍රේල් 4 |
| වත්මන් තත්ත්වය: පූවර් විභාග කටයුතු |

## 10. <u>නිලන්ත ජයවධර්නට එරෙහි රිට් නඩුව- රිට් 143/24</u>

| |
|---|
| නඩු අංකය: ලිඛිතව 143/24<br>වගඋත්තරකරුවන්: නිලන්ත ජයවධර්න<br>අධිකරණය: කොළඹ අභියාචනාධිකරණය<br>ඊළඟ දිනය: 2025 පෙබරවාරි 27<br>වත්මන් තත්ත්වය: තහවුරු කිරීම සඳහා |

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ (SIS) බරපතල රාජකාරි කඩවීමක් හෙළි වූ අතර, CSR විසින් 2022 අප්‍රේල් 20 දිනැති පැමිණිල්ලක් පොලිස්පතිවරයා වෙත යොමු කර එහි බරපතළකමට සෘජුවම වගකිව යුත්තේ හිටපු SIS අධ්‍යක්ෂ නිලන්ත ජයවධර්න බව පෙන්වා දෙයි. 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට තුඩු දුන් රාජකාරිය පැහැර හැරීම දණ්ඩ නීති සංග්‍රහයේ 100 (iii) වගන්තියට අයත් වන වරදකි. බෝම්බ ප්‍රහාරයන් පිළිබඳව තොරතුරු ලැබී තිබියදීත් 2019 අප්‍රේල් 21 සිදුවීම් වැළැක්වීමට පියවර නොගැනීම සම්බන්ධයෙන් කඩිනම් පරීක්ෂණ පවත්වා නිලන්ත ජයවධර්න අත්අඩංගුවට ගන්නා ලෙස එම පැමිණිල්ල මගින් CSR ඉල්ලා සිටියේය.

කෙසේ වෙතත්, පැමිණිල්ල විභාග කිරීම සම්බන්ධයෙන් ප්‍රගතියක් හෝ ප්‍රතිචාරයක් නොමැති බැවින්, CSR විසින් 2024 මාතර්‍ු 01 වන දින පොලිස්පති නිලන්ත ජයවධර්නට සහ නීතිපතිවරයාට එරෙහිව අභියාචනාධිකරණයෙන් පහත සඳහන් දෑ ඉල්ලා රිට් අයදුම්පතක් ගොනු කළේය.

i. නිලන්ත ජයවධර්නට එරෙහිව අපරාධ පරීක්ෂණ සහ/හෝ නඩු කටයුතු ආරම්භ කිරීම
ii ජනාධිපති විමශර්න කොමිසමේ සොයාගැනීම්/නිදෙර්ශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.
iii. ශ්‍රේෂ්ඨාධිකරණයේ ඔහු සම්බන්ධ තීන්දුව ක්‍රියාත්මක කිරීමට සහ/හෝ ඒ සඳහා පහසුකම් සැපයීමට සුදුසු ක්‍රියාමාගර්යක් ආරම්භ කිරීමට පියවර ගැනීම.

නිලන්ත ජයවධර්නට එරෙහි විනය පරීක්ෂණය සම්බන්ධයෙන් තවදුරටත් සහනයක් අපේක්ෂා නොකරන බව නොවැම්බර් 13 වැනි දින පෙත්සම්කරුවන්ගේ නීතිඥයන් අධිකරණයට දන්වා සිටියේය. මෙම තීරණය පදනම් වී ඇත්තේ ජාතික පොලිස් කොමිසමේ දැනට පවතින විමශර්නය සහ වගඋත්තරකරුගේ වැඩ තහනම් කිරීම මත ය. මේ වන විට, පෙත්සම්කරුවන් අපරාධ නඩු පැවරීමට අදාළ දෙවන සහනය හඹා යමින් සිටින අතර නඩුව විභාග කිරීමේ මූලික අදියරේ පවතී. ඊළඟ පියවර වන්නේ, මෙම කාරණය තහවුරු කිරීම සඳහා, නඩුව ඉදිරියට යාමට ප්‍රමාණවත් පදනමක් තිබේද යන්න අධිකරණය විසින් තක්සේරු කිරීමයි.

11. <u>මහජන ආරක්ෂක අමාත්‍යාංශයට එරෙහිව RTI අභියාචනා නඩුව- CA RTI/11/2023</u>

සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR) වෙනුවෙන් මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන මහජන ආරක්ෂක අමාත්‍යාංශයට තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) යටතේ අයදුම්පතක් ගොනු කර පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පොලිසියේ අතපසුවීම් වලට වත්මන් පොලිස්පතිවරයා ඇතුළු ඇතැම් පොලිස් නිලධාරීන්ට එරෙහිව ගෙන ඇති විනය ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය. CSR වෙත තොරතුරු නොලැබීම නිසා පසුව මේ සම්බන්ධයෙන් තොරතුරු කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කර, එමගින් 2023 නොවැම්බර් 24 වන දින අමාත්‍යාංශයට පක්ෂව තීන්දුවක් ලබා දෙන ලදි. එබැවින්, තොරතුරු කොමිෂන් සභාවේ මෙම තීරණයට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනා කරන ලද අතර දැනට වගඋත්තරකරුවන් අධිකරණයට පැමිනීමට නියමිතව ඇත. මේ වන විට පෙත්සම්කරුවන් RTI කොමිසම විසින් ගොනු කර ඇති මැදිහත්වීමේ පෙත්සම් වලට විරෝධතා ගොනු කරමින් සිටින අතර, එවැනි තොරතුරු නොමැති බව අමාත්‍යාංශය ප්‍රකාශ කළ විට RTI කොමිසම එම ස්ථාවරය පිළිගැනීමෙන් පසු මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයට එරෙහිව මෙම නඩුව පවරා ඇත.

නඩු අංකය: CA RTI/11/2023

වගඋත්තරකරු: මහජන ආරක්ෂක අමාත්‍යාංශය

අධිකරණය: කොළඹ අභියාචනාධිකරණය

ඊළඟ දිනය: 2025 මාතර්ු 6

වත්මන් තත්ත්වය: වගඋත්තරකරුවන් අධිකරණයට පැමිනීමට නියමිතව ඇත

## <u>වරදකරුවන් කවුරුද?</u>

රටට සිදුවූ සමාජ-ආර්ථික බලපෑම සහ දහස් ගණනක් ජනයා අත් විඳින මැනිය නොහැකි පාඩුව අමතක කළ නොහැකිය. මේ සියල්ල අවසානයේ දොස් පැවරිය යුත්තේ කාටද? යුක්තිය කුමක්ද?

2019 අප්‍රේල් 21 වැනි දින ජනාධිපතිවරයා විසින් හදිසි නීති රෙගුලාසි නිකුත් කළේ ප්‍රහාරයට සම්බන්ධ බවට සැක කරන පුද්ගලයන් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමේ බලය ආරක්ෂක අංශ වෙත ලබා දෙමිනි.[79] ඊළඟ සතියේ පුද්ගලයන් 200ක් පමණ අත්අඩංගුවට ගත් අතර[80] පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ ප්‍රධාන කණ්ඩායම් දෙකෙන් ආයුධ පුහුණුව ලබා ගැනීම සහ ඉගැන්වීමේ පන්තිවලට සහභාගී වීම සම්බන්ධයෙන් දුසිම් ගනනක් පුද්ගලයන්ට චෝදනා එල්ල විය.[81] NTJ සහ JMI සමඟ සම්බන්ධකම් ඇතිව බොහෝ අත්අඩංගුවට ගැනීම් සිදු කර ඇතත්, බොහෝ දෙනා ප්‍රශ්න කළේ කතාවේ තවත් දෙයක් තිබේද යන්න සහ ප්‍රහාර පිටුපස සිටින සැබෑ මහ මොළකරුවන් කවුරුන්ද යන්නයි.

බෝම්බ ප්‍රහාර පිළිබඳ විමශර්නය කිරීම සඳහා ජනාධිපති කමිටුවක් (විජිත් මලල්ගොඩගේ ප්‍රධානත්වයෙන්), ජනාධිපති විමශර්න කොමිසමක් (ජනක් ද සිල්වාගේ ප්‍රධානත්වයෙන්) සහ පාලර්මේන්තු තේරීම් කාරක සභාවක් (PSC) ඇතුළු කමිටු කිහිපයක් පත් කරන ලදී.

වාතර්ාවේ විධායක සාරාංශය සහ නිදෙර්ශ පමණක් නිකුත් වූ බැවින් ජනාධිපති කමිටු වාතර්ාව අධර් වශයෙන් නිකුත් කරන ලදී (<u>මෙතනින්</u> ප්‍රවේශ විය හැක). මෙම වාතර්ාව 2019 ජුනි 10 වන දින ඉදිරිපත් කළද, වාතර්ාව මහජනතාවට නිකුත් කර නොමැති බැවින්, CSR විසින් <u>මාධ්‍ය නිවේදනයක්</u> නිකුත් කර මින් ප්‍රහාරය පිටුපස ඇති කුමන්ත්‍රණය හෙළිදරව් විය හැකි බැවින් සම්පූණර් වාතර්ාව නිකුත් කිරීමේ වැදගත්කම අවධාරණය කර ඇත. "2023 ජනවාරි 26 වැනි දින, තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින් CSR විසින් ගොනු කරන ලද අභියාචනයක් විභාග කිරීමෙන් අනතුරුව 2023 පෙබරවාරි 9 වන දින වන විට ජනාධිපති කමිටු වාතර්ාව මහජනතාව වෙත නිකුත් කරන ලෙස

ජනාධිපති ලේකම් කායර්ාලයට නියෝග කර ඇත. කෙසේ වෙතත්, වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීම සඳහා ප්‍රසිද්ධ කරන ලද වාතර්ාවල ඇති ප්‍රධාන නිදෙර්ශ කිසිවක් ක්‍රියාත්මක කර නොමැත.

2019 මැයි මස 22 වැනි දින පත් කරන ලද පාලර්ීමේන්තු තේරීම් කාරක සභාව දළ වශයෙන් පුද්ගලයන් 60 දෙනකුගෙන් ඇසින් දුටු සාක්ෂි සහ සාක්ෂි ලබා ගැනීමෙන් අනතුරුව 2019 ඔක්තෝබර් 23 වැනි දින වාතර්ාව ඉදිරිපත් කළේය. මෙම වාතර්ාව ප්‍රකාශ කළේ ඉදිරි ප්‍රහාරය සම්බන්ධයෙන් පූවර් බුද්ධි තොරතුරු ලැබී ඇති නමුත් ඒ සම්බන්දයෙන් ක්‍රියාත්මක නොවූ බවයි (පිටුව 1). එබැවින්, SIS හි අධ්‍යක්ෂ, MOD ලේකම්, පොලිස්පති, CNI සහ DMI ඔවුන්ගේ වගකීම් පැහැර හැර ඇති අතර, අගමැති, රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය සහ නීතිපති දෙපාතර්මේන්තුව ද එය වැළක්වීමට අසමත් වූ බව මෙම කමිටුව විසින් නිගමනය කළේය.

"SIS හි මෙම විනාශකාරී ක්‍රියාව ශ්‍රී ලංකාවට සහ ශ්‍රී ලාංකිකයින්ට සිය ගණනක් මරණ, තවත් බොහෝ තුවාල සහ මැනිය නොහැකි විනාශයක් සඳහා හේතු වී ඇති අතර එය සැහැල්ලු ලෙස සැලකිය යුතු දෙයක් නොවේ." (pg 1)

ව්‍යුහාත්මක සහ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය සහ ව්‍යාජ ප්‍රවෘත්ති වලට එරෙහිව සටන් කිරීමට විවිධ ක්‍රම සහ ආරක්ෂක අභියෝගවලට මුහුණ දීම සඳහා ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය කමිටුව ප්‍රකාශයට පත් කළේය (pg.147-177). නමුත් මෙම වාතර්ාව ඉදිරිපත් කර වසර 5කට වැඩි කාලයක් ගතවී ඇතත් එම නිදෙර්ශ බොහොමයක් ක්‍රියාත්මක කර නොමැත. ජනාධිපති විමශර්න කොමිෂන් සභාව (PCOI) විසින් ඉදිරිපත් කරන ලද වාතර්ාව 2021 ජනවාරි 31 වන දින ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, අද වන විට ප්‍රසිද්ධියට පත් කර ඇත්තේ පළමු වෙළුම පමණි. රජයේ සහ බුද්ධි අංශවල අසාථර්කත්වයට හේතු වූ රටේ දේශපාලන තත්ත්වය මෙම වෙළුම තුලින් පෙන්වා දෙයි (pg.470).

‘‘මෙම ඛේදවාචකයට ජනාධිපති සිරිසේන සහ අගමැති ඇතුළු සමස්ත රජය වගකිව යුතුයි’’. (පිටු 471)

"පාස්කු ඉරිදා ප්‍රහාරය වැලැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් රාජ්‍යයේ සහ එහි නිලධාරීන්ගේ අතපසුවීම් රටේ රාජ්‍ය පරිපාලනයේ සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ වංශකථාවේ සිදු වූ ලොකුම රාජකාරි පැහැර හැරීමයි." (පිටු 471)

මෙම වාතර්ාව ත්‍රස්තවාදය මැඩපැවැත්වීම, ආගමික ඉගැන්වීම් නිරීක්ෂණය කිරීම සහ සහජීවනය සහ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පනත් සහ නීති පැනවීම සඳහා බොහෝ නිදෙර්ශ ඉදිරිපත් කරයි (pg.472). නමුත් තේරීම් කාරක සභා වාතර්ාවට සමානව මේ සියලු නිදෙර්ශ හා යෝජනා ක්‍රියාත්මක කර නොමැත.

පාස්කු ප්‍රහාරයට තුඩුදුන් සිදුවීම් විමශර්නය කිරීමට පත්කළ පාලර්ීමේන්තු තේරීම් කාරක සභාව (PSC) සහ විමශර්න කොමිෂන් සභාව (COI) යන දෙකම විසින් නිගමනය කළේ ඉන්දීය බුද්ධි අංශ වාතර්ාවලට අනුව ක්‍රියා කළේ නම් 2019 අප්‍රේල් 21 වැනිදා බෝම්බ ප්‍රහාර මගහරවා ගත හැකිව තිබුණු බවයි. [82]

එම වාතර්ා හෙළිදරව් කරන්නේ එම සැකයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත්, සිද්ධිය වැළැක්වීමටත් බලධාරීන්ට ප්‍රමාණවත් කාලයක් සහ ප්‍රමාණවත් බුද්ධි තොරතුරු තිබූ බවයි. SIS අධ්‍යක්ෂවරයාට 2019 අප්‍රේල් 4 සහ 5 යන දිනවල ඉන්දියාවෙන් බුද්ධි වාතර්ා ලැබුණු අතර අප්‍රේල් 20 වැනි දින නැවතත් ප්‍රහාරය සිදුවීමේ හැකියාව, සැකකරුවන්ගේ නම් සහ ත්‍රස්ත ප්‍රහාරයේ තත්වය විස්තර කරන වාතර්ා දෙකක් ලැබිණි. [83] මීට අමතරව, බෝම්බ ප්‍රහාරයට දින පහකට පෙර සහරාන්ගේ බලය සහිත ප්‍රදේශයක දුරස්ථ පාලක උපකරණයක් භාවිතයෙන් යතුරුපැදියක් පුපුරුවා හර පරීක්ෂණයක් ද සිදු කර ඇත. SIS පසු දින සිද්ධිය දැනගත් අතර, සහරාන් ත්‍රස්ත ප්‍රහාරයක් සැලසුම් කරමින් සිටින බව බුද්ධි අංශ ප්‍රකාශ කිරීමෙන් පසුව පවා නිසි පරීක්‍ෂණ සිදු වුණේ නැත. [84] ප්‍රහාරය සම්බන්ධයෙන් පෙර ලැබුණු තොරතුරු ප්‍රමාණය සහ ක්‍රියාත්මක නොවීම, විමශර්න සහ ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රහාර පිටුපස සිටින්නේ කවුරුන්ද යන ප්‍රශ්නය මතු වුයේය.

"ලැබෙන බුද්ධි තොරතුරු ශ්‍රී ලංකාවේ පොලිස් ලිපිගොනුවල සහරාන් පිළිබඳ තොරතුරු සමඟ සම්බන්ධ කිරීමට අසමත් වී ඇත. එහෙත්, රජය ඊට වඩා දැඩි උත්සාහයක් දැරිය යුතුව තිබිණි." [85]

ශ්‍රී ලංකාවේ පල්ලි සහ හෝටල් ඉලක්ක කර නුදුරේදීම ප්‍රහාර එල්ල විය හැකි බවට අමෙරිකාව සහ ඉන්දියාව යන දෙරටම බුද්ධි අංශ වාතර්ා මගින් අනතුරු අඟවා තිබූ මුත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල්

වික්‍රමසිංහ යන දෙදෙනාම ක්‍රියා කළේ දැඩි නොසැලකිල්ලෙනි.[86] අවාසනාවන්ත සිදුවීම සිදු වූ අවස්ථාවේදී පවා විධායක ජනාධිපති සිරිසේන මහතා රටින් බැහැරව සිටි අතර ආපසු පැමිණියේ සිද්ධිය සිදුවී සැහෙන වේලාවකට පසුවය.[87]

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ යන දෙදෙනාම මරාගෙන මැරෙන ප්‍රහාර ගැන අනතුරු අඟවා තිබූ බහුවිධ බුද්ධි වාතර්ා [...] පිළිබඳ නොදැන සිටි බව ප්‍රකාශ කළහ.[88]

පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති විමශර්න කොමිෂන් සභාවේදී ලබාදුන් වැදගත්ම සාක්ෂි හතර ලැබීමෙන් පසු සමාජය හා සාමයික මධ්‍යස්ථානය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ, "... බෝම්බ ප්‍රහාරය පිළිබඳ තොරතුරු ලබාගෙන තිබියදී සහ සාමාජිකත්වය ඉතා සීමිත JMI තුළ ඔත්තුකරුවකු ඇතුළත් කර සිටියදී පවා එය වළක්වා ගැනීමට කටයුතු කිරීම පුදුමයට කරුණකි.[89] බෝම්බ ප්‍රහාර වැළැක්විය නොහැකි වූයේ කාගේ බලපෑම යටතේද සහ ප්‍රහාර පිටුපස සිටින්නේ කවුරුන්ද යන්න පිළිබඳව තොරතුරු ප්‍රසිද්ධියේ හෙළි කළ යුතු බව CSR ඉල්ලා සිටියේය.[90] පෙත්සම් 12 ගේ මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව හරහා කිහිප දෙනෙකුට ප්‍රහාර වැලැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වන්දි ගෙවන ලෙස නියෝග කළද, ප්‍රහාර සැලසුම් කළේ කවුරුන්ද සහ අරමුණ කුමක්ද යන්න පිටුපස ඇති සත්‍යය සැඟවී ඇත.

**චැනල් 04 විසින් පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ වාතර්ාමය චිත්‍රපටය**

මෑතදී චැනල් 04 කළ වාතර්ා චිත්‍රපටය රට තුළ සැලකිය යුතු ආන්දෝලනයකට තුඩු දුන් නමුත් බොහෝ ශ්‍රී ලාංකිකයන් දැනටමත් දැන සිටි දේට වඩා සැලකිය යුතු අලුත් දෙයක් හෙළි කිරීමට එය අපොහොසත් විය. ඉස්ලාමීය අන්තවාදීන් සමඟ හමුදා බුද්ධි අංශ සම්බන්ධ බවට එල්ල වන චෝදනා බොහෝ ශ්‍රී ලාංකිකයන්ට අලුත් කරුණක් නොවේ.[91]

කෙසේ වෙතත්, චැනල් 04 වාතර්ා චිත්‍රපටය වත්මන් එස්අයිඑස් ප්‍රධානී සුරේෂ් සලේට එරෙහිව[92] නව චෝදනා එල්ල කළේ සිදුවීම් මාලාව රාජපක්ෂ පවුලට සහ විශේෂයෙන් ගෝඨාභය රාජපක්ෂට ඇති සම්බන්ධය පෙන්වා දෙමිනි. 2019දී රාජපක්ෂලා නැවත බලයට ගෙන ඒමේ කුමන්ත්‍රණයක් තිබුණු බව වීඩියෝවෙන් ඇඟවේ. 2019 බෝම්බ ප්‍රහාරයෙන් දින කිහිපයක් ඇතුළත ගෝඨාභය එළියට ආවේ ඉස්ලාමීය අන්තවාදීන් අතුගා දැමිය හැකි ජාතික ආරක්ෂක අපේක්ෂකයා තමා බව ප්‍රකාශ කරමිනි.[93]

"ගෝඨාභය රාජපක්ෂ මෙම වාතර්ා චිත්‍රපටයට ප්‍රතිචාර දක්වා ඇති අතර ඔහු 2015 සහ 2019 අතර බලයෙන් ඉවත්ව සිටියදී සුරේෂ් සලේට බලපෑම් නොකළ බව සහ බුද්ධි අංශ සමඟ කිසිදු ගනුදෙනුවක් සිදු නොකළ බවත් බුද්ධි හා ආරක්ෂක අංශ සමඟ කිසිදු සම්බන්ධයක් නොතිබූ බවත් ප්‍රකාශ කර ඇත."[94]

ඇත්ත වශයෙන්ම, චැනල් 04 වීඩියෝව කිසිදු පිළිතුරක් ලබා නොදෙන නමුත් එය තවත් සැකයන් සහ ප්‍රශ්න කිහිපයක් මතු කරයි. කාදිනල් රංජිත් හිමිපාණන් විසින්ම ප්‍රකාශ කරන ලද පරිදි, සංහාරයේ සියලු අංශ පිළිබඳව ස්වාධීන, විනිවිද පෙනෙන, ජාත්‍යන්තරව පිළිගත හැකි පරීක්ෂණයක් සඳහා කාලය පැමිණ තිබේ. රජය එය කළ යුතු වන්නේ ප්‍රහාරයෙන් වින්දිතයින්ට සහ දිවි ගලවා ගත් අයට පමණක් නොව පොදු ජනතාව වෙනුවෙන් කළ යුතු නිවැරදි දෙය එය බැවිනි.[95]

චැනල් ෆෝ වාතර්ාමය චිත්‍රපටය එළිදැක්වීමෙන් පසු එවකට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් තවත් වාතර්ා දෙකක් ඉදිරිපත් කිරීමට සලස්වන ලදී. "ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්.අයි. ඉමාම්ගේ නායකත්වයෙන් යුත් එක් වාතර්ාවක් ශ්‍රී ලංකාවේ ඇතැම් බුද්ධි අංශවල සම්බන්ධය පිළිබඳ වාතර්ා චිත්‍රපටයේ චෝදනා විමශර්නය කිරීමට පත් කරන ලදී. විනිසුරු ඒ.එන්.ජේ. ද අල්විස්ගේ ප්‍රධානත්වයෙන් යුත් දෙවන වාතර්ාවේ අවධානය යොමු වූයේ රාජ්‍ය

බුද්ධි සේවය සහ අනෙකුත් අදාළ බලධාරීන් විසින් ගෙන ඇති ක්‍රියාමාගර් මෙන්ම ලැබුණු පූවර් බුද්ධි තොරතුරු විමශර්නය කිරීමටය. මෙම වාතර්ා දෙකම යම් විවේචනයට ලක් වූ අතර මෑතක දී අවධානයට ලක් විය. විනිසුරු ද අල්විස් ගේ ප්‍රධානත්වයෙන් යුත් වාතර්ාව මගින් ශානි අබේසේකරට සහ රවී සෙනෙවිරත්නට ඔත්තු සේවයේ ඔවුන්ගේ භූමිකාව සම්බන්ධයෙන් චෝදනා කර ඇත. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විසින් මෙම නිලධාරීන් දෙදෙනා නැවත සේවයට පත් කිරීමට විරෝධය පළ කළ උදය ගම්මන්පිල කියා සිටියේ මහජන පෙත්සමකට අත්සන් තැබීම ආරම්භ කරන බවයි කෙසේවුවත් විපක්ෂයේ එස්.ජේ.බී ඔවුන්ගේ පත්වීමට සහය පළ කරන ලදී. මෙම වාතර්ාව සම්බන්ධයෙන් ඇතැම් කරුණු විකෘති කර වැරදි ලෙස අථර්කථනය කර ඇති බව පවසමින් ජ්‍යොෂ්ඨ පොලිස් නිලධාරියෙකු නීතිමය පියවර ගැනීමට සැලසුම් කර තිබේ. පල්ලියේ ලිපිනය සහ කොළඹ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධිකරණ බලය වැරදි ලෙස සඳහන් කර ඇති බව එම නිලධාරියා ප්‍රකාශ කරයි.

"මෙම වාතර්ාව යමෙකුගේ න්‍යාය පත්‍රයට ගැලපෙන පරිදි සකස් කර ඇති බව පෙනේ"

2024 ඔක්තෝබර් 14 වැනිදා පිවිතුරු හෙළ උරුමයේ නායක උදය ගම්මන්පිල ප්‍රසිද්ධියේ ප්‍රශ්න කරමින් විමසා සිටියේ ජනාධිපතිවරයා තවමත් එම වාතර්ා දෙක නිකුත් නොකළේ මන්දැයි කියාය. ජනාධිපතිවරයා ජාතික වගවීමට වඩා පක්ෂ අවශ්‍යතාවලට මුල්තැන දෙමින් කටයුතු කරන බව පවසමින් ගම්මන්පිල මහතා ජනාධිපතිවරයා දැඩි ලෙස විවේචනය කළ අතර, වාතර්ාව රඳවා තබා ගැනීමෙන් මහජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝණය වන බැවින් එය විනිවිදභාවයට බාධාවක් වන බවද ඔහු තවදුරටත් කියා සිටියේය. ඊට ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ප්‍රතිචාරය වූයේ පොලිසිය විසින් අලුතින් පරීක්ෂණයක් පවත්වන බැවින් මෙම වාතර්ා නිකුත් නොකරන බවයි. විජිත හේරත් අමාත්‍යවරයා ප්‍රකාශ කළේ එම වාතර්ාවල සම්පූණර්ත්වය සහ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ඒවා හොඳින් පරීක්ෂා කළ යුතු බවත්, යුක්තිය පසිඳලීමට කටයුතු කරන බවත්, ප්‍රහාරවලට වගකිව යුතු සියලු දෙනාට නිසි නීතිමය මාගර්වලට අනුව කටයුතු කරන බවත්ය. ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා හිටපු පාලර්මේන්තු මන්ත්‍රී ගම්මන්පිල මහතා විවේචනය කරමින් පාස්කු ඉරිදා බේදවාවකය දේශපාලන වාසි තකා යොදා ගත් බවට චෝදනා කළ අතර අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ වත්මන් විමශර්න කඩාකප්පල් කිරීමෙන් හෝ එයට බාධා කිරීමෙන් වළකින ලෙසද ඉල්ලා සිටියේය. ඒ.එන්.ජේ.ද අල්විස් යනු ''මිනීමැරුම් පරීක්‍ෂණයක සාක්‍ෂි වසන් කිරීම සහ විනාශ කිරීමේ චෝදනාවට ලක්ව සිටින'' ප්‍රසන්න ද අල්විස්ගේ සොහොයුරිය වන බැවින් මෙම වාතර්ාවල නිරවද්‍යතාවය පිළිබඳ පරස්පර ගැටුමක් ඇති බවත් එබැවින් එම වාතර්ාව අපක්ෂපාතී හෝ ස්වාධීන ලෙස සිදු වූවක් බවට සැලකිය නොහැකි බවත් ගාමිණී පියතුමා තව දුරටත් ප්‍රකාශ කළේය.

සමාජය හා සාමයික කේන්ද්‍රයේ (CSR) අධ්‍යක්ෂ රොහාන් සිල්වා පියතුමා මාධ්‍යවේදී තරිඳු ජයවධර්න සමඟ එක්ව වින්දිතයන්ට යුක්තිය සහතික කිරීම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන ක්‍රියාමාගර් සහිත යෝජනාවක් ඉදිරිපත් කළේය (ඇමුණුම 3). "චැනල් 4 වාතර්ා චිත්‍රපටයේ ප්‍රධාන සාක්ෂිකරු වන අසාද් මවුලානාට අනෙකුත් සාක්ෂිකරුවන්ට සහ ඔත්තුකරුවන්ට නැවත වරක් සාක්ෂි හෝ තොරතුරු සැපයීමට අවස්ථාව ලබා දිය යුතු බව යෝජනාවෙන් අවධාරනය කර ඇත. වාතර්ා චිත්‍රපටයේ සිදු කර ඇති ප්‍රකාශවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා පුළුල් පරීක්ෂණයක් පැවැත්විය යුතු බව යෝජනාවෙන් අවධාරණය කර ඇත. මෙම යෝජනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කල පැමිණිල්ලකින් පසු පිල්ලෙයාන්, සිවනේෂතුරෙයි චන්ද්‍රකාන්තන් සහ හිටපු යුද හමුදා බුද්ධි අංශ අධ්‍යක්ෂ සුරේෂ් සලායි අතර සම්බන්ධය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව (CID) විසින් පරීක්ෂණයක් ආරම්භ කර තිබේ.

ඊට අමතරව සුරේෂ් සලෙයි මහතා ප්‍රහාරයට සම්බන්ධ ද යන්න පැහැදිලි කරගන්නා තුරු රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ ධූරයෙන් ඔහුව වහාම ඉවත් කර පාස්කු ප්‍රහාරය පිළිබඳ මූලික පරීක්ෂණ පැවැත්වූ කණ්ඩායම් යළි පත් කර පරීක්ෂණ නැවත ආරම්භ කළ යුතු බවට මෙම යෝජනාවෙන් ඉල්ලා තිබේ. සමාජය හා සාමයික කේන්ද්‍රය මගින් එල්ල වූ බලපෑම් හේතුවෙන් සුරේෂ් සලෙයි මහතා ධූරයෙන් ඉවත් කර, ශානි අබේසේකර ඇතුළු පිරිස කොන්ත්‍රාත් පදනම මත නැවත තනතුරුවලට පත් කරන ලදී. පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ පරීක්ෂණ යළි ආරම්භ කරන බව ද ශ්‍රී ලංකා පොලිසිය නිවේදනය කර ඇති අතර, එය ක්‍රියාත්මක කළ හොත් වින්දිතයන්ට සාධාරණය ඉටු වනු ඇති බවට පෙනී යයි.

# කරමින් තිබෙන්නේ කුමක්ද?

## හානිපූරණය

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කායර්ාලය වින්දිතයින්ට ප්‍රමාණවත් වන්දියක් ලබා දෙන ලෙසත්, අරමුදල් බෙදා හැරීමේදී ඔවුන්ගේ සහ ඔවුන්ගේ නියෝජිතයින්ගේ උපදෙස් වලට සවන්දෙන ලෙසත් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියේය. [96]

පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූවන් සම්බන්ධයෙන් වන්දි ගෙවීමේ ක්‍රියාවලියේදී රජය සහ රාජ්‍ය නොවන ආයතන සැලකිය යුතු කායර්භාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, අරමුදල් බෙදා හැරීමේදී හඳුනාගත් සැලකිය යුතු කරුණක් වන්නේ වින්දිතයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තොරතුරු නිවැරදිව තහවුරු නොකළහොත්, ඇතැම් වින්දිතයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ඔවුන්ගේ නියම කොටස නොලැබිය හැකි බවයි. මෙය ඉතා ගැටළු සහගත සහ අසාධාරණ තත්ත්වයකි. එබැවින්, කිසිවෙකු නොසලකා හැරීම හෝ අමතක නොවන බව සහතික කිරීම සඳහා මරණ සංඛ්‍යාව ඉතා සූක්ෂමව සහ නිවැරදිව තහවුරු කිරීමේ අවශ්‍යතාවය අපි නැවත අවධාරණය කරමු.

සෙත් සරණ ( කොළඹ අගරදගුරු පදවියේ සමාජ අංශය) විසින් 2019 දී කරන ලද නිවේදනයකට අනුව ඔවුන් වෙත රුපියල් මිලියන 350.7 ක් ලැබිණි. [97] ඒ අනුව, මුළු ප්‍රතිපාදනවලින් විශාලතම මුදල වින්දිත දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අරමුදල් සැපයීමට සහ අවුරුදු පහ දක්වා අලුත උපන් දරුවන් සඳහා මාසික දීමනාවක් ලබා දීම සඳහා යෙදවීමට නියමිතය. [98] 2019 වන විට ප්‍රතිපාදන වෙන්කොට තිබූ ආකාරය පහත් දැක්වෙන වගුවේ දැකිය හැකිය. [99]

| වගර්ය | ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|
| ළමා අධ්‍යාපනය | 102 |
| වන්දි | 16.8 |
| වෛද්‍ය වියදම් | 17.8 |
| වින්දිතයින්ගේ දෛනික වියදම් | 35 |
| රජයේ සහාය ඇතිව නිවාස ඉදිකිරීමට ඉඩමක් මිලදී ගන්නට | 53 |
| මඩකලපුව සියොන් දේවස්ථානය ඉදිකරන්නට | 10 |
| අඩු ආදායම්ලාභී පවුල් | 30 |
| ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රතිකාර කිරීම | 32 |

මේ අතර, බේදවාචකයෙන් මානසිකව පීඩාවට පත් වූවන් සඳහා උපදේශන සැපයීම සඳහා කාදිනල්තුමාගේ අධීක්ෂණය යටතේ Dialog පදනමේ “Rally to Care” වැඩසටහනේ සහාය ඇතිව උපදේශන මධ්‍යස්ථානයක් ද පිහිටුවා ඇත. [100] රජය සමඟ එක්ව, ස්ථිර පදිංචියක් නොමැති පවුල් සඳහා නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් මිලදී ගැනීමට රුපියල් මිලියන 53ක් වෙන් කර ඇත. [101]

පෙත්සම් 12 හේ මූලික අයිතිවාසිකම් නඩුවේදී 2023 ජනවාරි 12 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද නියෝගය පරිදි පිහිටුවන ලද වින්දිත අරමුදල 2023 ජනවාරි 19 දින සිට බලපැවැත්වෙන පරිදි රාජගිරිය ශාඛාවේ ලංකා බැංකුවේ (BOC) ගිණුම් අංක 0090167960 යටතේ ‘2019 අප්‍රේල් පාස්කු ප්‍රහාරය - වින්දිත අරමුදල' නමින් ස්ථාපිත කර ඇත. මෙම අරමුදලට දායක වන ලෙස පුද්ගලයන්ගෙන් ඉල්ලා සිටින නිවේදනයක් 2023 ජනවාරි 29 වැනි දින සිළුමිණ, වීරකේසරි, සන්ඩේ ඔබ්සවර්ර්, ලංකාදීප, තිනකරන් සහ ද සන්ඩේ ටයිම්ස් පුවත්පත්වල පළ විය. වන්දි නොගෙවීම සහ අඩුවෙන් ගෙවීම සම්බන්ධයෙන් විමශර්න අවසන් කර ගරු නීතිපතිවරයා වෙත 2023 මාතර්ු 14 දිනැති ලිපියක් මගින් ලබාදෙ ලදි. වින්දිත අරමුදලෙන් ගෙවීම් කිරීමේ යෝජනා ක්‍රමය 2023 ජනවාරි මාසයේදී සකස් කරන ලදි.

ප්‍රහාරයෙන් පීඩාවට පත් වූ පුද්ගලයින්ගේ අවශ්‍යතා මත පදනම් වූ ඇගයීමකට අනුව අරමුදලෙන් මුදල් ලබා දීම තීරණය කරනු ලැබේ.[102]

| වින්දිත ප්‍රවගර්ය | ගෙවන ලද මුදල | ගෙවන ලද දිනය |
|---|---|---|
| මුළුමනින්ම හෝ ස්ථිරව ආබාධිත පුද්ගලයන් | රු. 2,500,000/= (රු. 500,000 බැගින්) | 17-08-2023 |
| පවුලේ ආදායම් ලබන්නා මිය යාම නිසා ආර්ථික හානි සිදු වූ පවුල් වෙනුවෙන් | රු. 29,225,000/= (රු. 175,000 බැගින්) | 04-10-2023 |
| අර්ධ වශයෙන් ස්ථිරව ආබාධිත වූ පුද්ගලයන් (වෛද්‍ය නිලධාරිවරයාගේ සහතිකය අනුව 70%ට වඩා ආබාධිත වූ අය) | රු. 2,400,000/= (රු. 100,000 බැගින්) | 31-10-2023 |
| එකතුව | රු. 34,125.000/= | 2023 ඔක්තෝබර් 31 වන විට |

මූලාශ්‍රය- *https://reparations.gov.lk*

පවුල් ඒකකයේ ආර්ථිකයට දායක වූ හෝ දායක වන්නට සිටි පවුලේ සාමාජිකයකු මියයාමෙන් මූල්‍යමය වශයෙන් පාඩු ලැබූ පවුල් සඳහා ප්‍රමුඛතා පදනම මත සහන සැලසීම සඳහා පවතින සීමිත මුදල් යෙදවීමට හානිපූරණ කාර්යාලය තීරණය කළේය.[103] වයස අවුරුදු 18ට වැඩි සෑම වින්දිතයෙකුම එම කාණ්ඩයට අයත් වේ. පවුලේ ළාබාල සාමාජිකයන් අහිමි වූවන්ගේ දුක් වේදනා නොතකා හැරීමට හෝ අඩුවෙන් සැලකීමට කැමති නැති නමුත් සහන සැලසීමට කටයුතු කරන්නේ මූල්‍යමය පාඩු සඳහා පමණක් ය යන පදනමින් හානිපූරණ කාර්යාලය කටයුතු කරගෙන ගියේය.[104]

ගෙවා ඇති ඉහත ගෙවීම් පිළිබඳ සවිස්තරාත්මක සාරාංශයක් ඇමුණුම 04 යටතේ දක්වා ඇත.

දිවි ගලවා ගත් අයගේ සහ වින්දිතයින්ගේ පවුල්වල ජීවන වියදම් සඳහා දායක වූ රාජ්‍ය නොවන සංවිධාන සහ තනි පරිත්‍යාගශීලීන් බොහෝ ඇත. අරමුදල් රැස් කිරීම සඳහා CSR විසින් රාජිත දිසානායක අධ්‍යක්ෂණය කළ ' 2019 ජූලි මාසයේ දවසක්' වේදිකා නාට්‍යය ප්‍රදර්ශනය කරන ලද අතර එය 2023 මාතර්‍ 18 වන දින ටවර් හෝල්හිදී පැවැත්විණි. මෙම නාට්‍යය සමාජයට එල්ල කරන ප්‍රහාරවල බලපෑම තේමා කර ගත් එකකි. මීට අමතරව, සියලු උපයාගත් අරමුදල් අවශ්‍යතා ඇති වින්දිතයින්ට ඉක්මනින් උපකාර කිරීම සඳහා යොදවා ඇත. විශේෂයෙන්ම වින්දිතයින්ගෙන් එක් අයෙකුගේ කන් සුව කිරීමට ශල්‍යකමර්යක් අවශ්‍ය විය. වාසනාවකට මෙන්, මෙම සැත්කම නොමිලේ සිදු කිරීමට හැකි විය. කෙසේ වෙතත්, CSR විසින් වැනල් කිරීම, ප්‍රවාහනය සහ වෙනත් ශල්‍යකමර් සම්බන්ධ වියදම් ආවරණය කරන ලදි. ශල්‍යකමර්යට පසු සම්පූණර් විවේකයක් අවශ්‍ය වන අතර ඔහුට ජීවනෝපාය උපයා ගැනීමට නොහැකි වන බැවින්, මාස තුනක ජීවන වියදම් ආවරණය කරන ලදි. එය මසකට රු. 50,000/=ක් පමණ විය. මේ වන විටත් ඔහු ශ්‍රවණාබාධ ගැටලුවලට මුහුණ පා සිටින අතර වැඩිදුර ශල්‍යකමර් සිදු කරන ලෙස වෛද්‍යවරුන් ඔහුට උපදෙස් දී තිබේ. මීට අමතරව, පාස්කු ප්‍රහාරයෙන් දිවි ගලවා ගත් තේ වතු කම්කරු ප්‍රජාවේ තවත් තිදෙනෙකුගේ ජීවනෝපාය සහ පෞද්ගලික අවශ්‍යතා සඳහා CSR සහාය විය.

<u>යුක්තිය සඳහා ජාතික සහ ජාත්‍යන්තර ව්‍යාපාරය</u>

වසර පහක් තිස්සේ කතෝලික පල්ලිය පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ට යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා සිටියේය. ඔවුහු මාධ්‍ය සාකච්ඡා, පෙළපාලි, සම්මන්ත්‍රණ සහ මාධ්‍ය දැනුවත් කිරීම් ඇතුළු උද්දේශන ක්‍රම කිහිපයක් භාවිතා කරති. විමශර්න කොමිෂන් සභාවේ නිදෙර්ශ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රහාරය පිටුපස සිටින මහ මොළකරු නම් කිරීම ප්‍රධාන ඉල්ලීමයි.[105] ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය 2021 දී හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වෙත යොමු කරන ලද ලිපියක් මගින් ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කර මාසයක් ඇතුළත ප්‍රතිචාරයක් ඉල්ලා සිටියේය.[106]

'ඒ හා සමානව, එය අවසන් කළ යුත්තේ පහත සඳහන් ප්‍රධාන ප්‍රශ්නවලට පිළිතුරු සපයන බරපතල පරීක්ෂණයක් පැවැත්වීමෙන් පමණක් බව අපි විශ්වාස කරමු:

මේ ප්‍රහාර පිටුපස කුමන්ත්‍රණයක් තිබුණාද?

මෙම ප්‍රහාරවල අරමුණු මොනවාද?

මේ ප්‍රහාරවලට සම්බන්ධ අය කවුද?

මෙම විමශර්නවල ප්‍රතිඵල මහජනතාවට දැනගත හැකි විය යුතුයි.[107]

එහි වැඩිදුරටත් මෙසේ සඳහන් විය.

එබැවින් මෙම පාස්කු ත්‍රස්ත ප්‍රහාරයට අදාළ නීතිමය ක්‍රියාමාගර් අවසන් විය යුත්තේ සෘජුව සම්බන්ධ වූ සියලු දෙනාට සහ ඔවුන්ට සහය වූ සියලු දෙනාට, මෙම ප්‍රහාරයන් සැලසුම් කළ මහ මොළකරුවන්ට, මෙම ප්‍රහාරවලට නායකත්වය දුන් අයට, මෙම සමූලඝාතන වැළැක්වීමට හැකිව තිබියදී, එය නොසලකා හැරිය සියලු දේශපාලන නායකයන්ට, රාජ්‍ය නිලධාරීන්ට, පොලිස් සහ බුද්ධි සේවා නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමෙන් පමණක් බව අපගේ දැඩි විශ්වාසයයි.[108]

මේ අනුව, කතෝලික පල්ලියේ ක්‍රියාකාරීත්වය, කොළඹ අගරදගුරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන්ගේ යුක්තිය සඳහා අඛණ්ඩ ක්‍රියාමාගර් සහ නඩු ශ්‍රී ලංකාවේ පාස්කු ප්‍රහාරයට ගොදුරු වූවන් සම්බන්ධයෙන් යුක්තිය සඳහා වූ ව්‍යාපාරයේ හරය ලෙස ප්‍රධාන වශයෙන් සාරාංශගත කළ හැකිය. මීගමුව පුරවැසි කමිටුව, අප්‍රේල් 21 යුක්තිය සඳහා පදනම, CSR සහ සෙත් සරණ ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන ඉහත කී යුක්තිය සඳහා වූ ව්‍යාපාරයේ අඛණ්ඩව ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි.

ජාත්‍යන්තර ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ගත් කල, 2019 වසරේ ශ්‍රී ලංකාවේ පල්ලි සහ හෝටල්වලට එල්ල වූ පාස්කු ප්‍රහාරයට වගකිව යුතු ඉස්ලාමීය රාජ්‍යය නම් සංවිධානයට සම්බන්ධ වූ ශ්‍රී ලාංකිකයින් තිදෙනෙකුට ත්‍රස්තවාදයට අනුබල දීම සම්බන්ධයෙන් එක්සත් ජනපද අධිකරණ දෙපාතර්මේන්තුව විසින් චෝදනා ගොනු කර ඇත. චෝදනා එල්ල වී ඇත්තේ මොහොමඩ් නවුෆර් හෙවත් "දෙවන එමීර්" සහ ශ්‍රී ලංකාවේ ISIS සඳහා බඳවා ගන්නෙකු සහ පුහුණුකරුවෙකු වන ප්‍රහාර සඳහා යොදාගත් බෝම්බ නිෂ්පාදනයට උදව් කළ බව කියනු මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන්, ප්‍රහාරයකින් පොලිස් නිලධාරියෙකු ඝාතනය කළ අහමඩ් මිල්හාන් හයාතු මොහොමඩ් යන අයයි.[109] ඔවුන් තිදෙනාම මේ වන විට ශ්‍රී ලංකාවේ අත්අඩංගුවේ පසුවන අතර, ඔවුන් නිදහස ලබා ගන්නේ නම්, එක්සත් ජනපදයේ චෝදනා දිගටම විභාග කරගෙන යන අතරම, එම රට තුළ ඔවුන්ට නඩු පැවරීමට සහාය දෙන බව දෙපාතර්මේන්තුව ප්‍රකාශ කර තිබුණි. එම ප්‍රහාරයෙන් අමෙරිකානු පුරවැසියන් පස් දෙනෙකු ජීවිතක්ෂයට පත්ව තිබේ.[110]

"ලෝකයේ ඕනෑම තැනක ඇමරිකානුවන් ඉලක්ක කරන ත්‍රස්තවාදීන්ට එරෙහිව යුක්තිය ඉටුවීම සහතික කිරීමට එක්සත් ජනපදය තීරණාත්මක ක්‍රියාමාගර් ගන්නා බව මෙම නඩුව පැහැදිලිවම පෙන්නුම් කරයි," යනුවෙන් නඩුව ගොනු කළ ලොස් ඇන්ජලීස් හි එක්සත් ජනපද ෆෙඩරල් අභිචෝදක නික් හැනා පැවසීය. [111]

## නිදෙර්ශ

රට තුළ සිදුවූ බිහිසුණුම පශ්චාත් යුද ප්‍රහාරය ලෙස පාස්කු ඉරිදා සංහාරය හඳුනාගත හැකිය. එහිදී ප්‍රධාන වශයෙන් මෙරට පල්ලි සහ හෝටල් ඉලක්ක කරන ලදි. එය විසින් කරන ලද විනාශය එහි බලපෑමේ විශාලත්වය පිළිබිඹු කරමින් වාතර්ාවේ පැහැදිලි කර ඇත. වසර පහක් ගතවී ඇතත් ආපදාවට ලක්වූවන් වෙනුවෙන් යුක්තිය සම්පූණර්යෙන් ඉටුවී නැත. මේ අනුව, ප්‍රහාරයට ගොදුරු වූවන් සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා නිදෙර්ශ කිහිපයක් පහත සඳහන් කර ඇත.

- පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලුම අධිකරණ නඩු විභාග කඩිනම් කිරීම.
- වඩාත්ම වගකිවයුතු අයට, විශේෂයෙන් මහ මොළකරුවන්ට එරෙහිව ජාත්‍යන්තර විමශර්න සහ නඩු පැවරීම් සිදුකිරීම.
- ප්‍රහාරය පිටුපස සිටින මහ මොළකරුවන් සහ චේතනාවන් සොයා ගැනීම සඳහා විශ්වසනීය ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් පරීක්ෂණ පැවැත්වීම.
- පාස්කු ප්‍රහාරය සඳහා ප්‍රමාණවත් වන්දි මුදල් කඩිනමින්, සාධාරණ හා විනිවිදභාවයකින් යුතුව සියලුම වින්දිතයන් වෙත ලබා දෙන බවට සහතික වීම.
- පාස්කු ප්‍රහාරයට අදාළ සියලුම වාතර්ා ප්‍රසිද්ධ කිරීම.
- ජනාධිපති විමශර්න කොමිෂන් සභාව සිය අවසන් වාතර්ාවේ දක්වා ඇති නිදෙර්ශ ක්‍රියාත්මක කිරීම.
- පාස්කු ප්‍රහාරයෙන් සිදුවූ නිවැරදි මරණ සංඛ්‍යාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- චැනල් 4 වාතර්ාමය චිත්‍රපටයේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් පූණර් පරීක්ෂණයක් පැවැත්වීම.

[1] "Sri Lanka Attacks: What We Know about the Easter Bombings." *BBC News*, BBC, 28 Apr. 2019, www.bbc.com/news/world-asia-48010697.

[2] Centre for Society and Religion. "Death Toll in Sri Lanka Easter Sunday Attacks-contradictions in numbers'". *Centre for Society and Religion*, 19 Feb 2025. https://easterattack.info/csr-reports-2025/

[3] "Sri Lanka Attacks: What We Know about the Easter Bombings." *BBC News*, BBC, 28 Apr. 2019, www.bbc.com/news/world-asia-48010697.

[4] "After Sri Lanka's Easter Bombings: Reducing Risks of Future Violence." *Crisis Group*, 17 Feb. 2021, www.crisisgroup.org/asia/south-asia/sri-lanka/302-after-sri-lankas-easter-bombings-reducing-risks-future-violence.

[5] Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.

[6] "CSR officially receives four most important evidence given at the Presidential Commission of Inquiry on the Easter Attacks': Further established that the security forces had prior information of the bombers." Centre for Society and Religion, 19 Jan. 2024.

[7] "SC FR 163/2019." Supreme Court, https://www.supremecourt.lk/images/documents/sc_fr_163_2019.pdf. Accessed 28 Mar. 2024.

[8] Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.

[9] "Channel 4- Why Now? Why Not?", *The Island*, 10 Sept 2023, https://island.lk/channel-4-why-now-why-not/

[10] 'Actions taken by or on orders made by the Supreme Court', *Office for Reparations Sri Lanka*. https://reparations.gov.lk/web/index.php?option=com_content&view=article&id=153:action-taken-by-or-on-orders-made-by-the-supreme-court&catid=8:news-and-events&lang=en&Itemid=282

[11] Centre for Society and Religion. "The Highlights of 11 Main Easter Attacks Court Cases (1st January 2021- 21st June 2023)," *Centre for Society and Religion*, 21st June 2023. https://easterattack.info/csr-reports/.

[12] Pokharel, Sugam, et al. "Bombs Tear through Sri Lankan Churches and Hotels, Killing 250 People." CNN, Cable News Network, 25 Apr. 2019, https://edition.cnn.com/2019/04/21/asia/sri-lanka-explosions/index.html

[13] Pokharel, Sugam, et al. "Sri Lanka Attacks: What We Know about the Easter Bombings." BBC News, BBC, 28 Apr. 2019, www.bbc.com/news/world-asia-48010697

[14]Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.

[15]Written statement* submitted by Franciscans International, a non-governmental organization in general consultative status." United Nations, 5 Feb. 2024.

[16] "Sri Lanka Attacks: Who Are the Victims?" BBC News, BBC, 26 Apr. 2019, www.bbc.com/news/world-asia-48002169.

[17] "Fifteen Dead in Sri Lanka after Shootout with Suspected Islamist Militants." NBCNews.Com, NBCUniversal News Group, 27 Apr. 2019, www.nbcnews.com/news/world/fifteen-dead-sri-lanka-after-shootout-suspected-islamist-militants-n999131.

[18] "Fifteen Dead as Sri Lanka Forces Raid Suspects' Hideout." Al Jazeera, Al Jazeera, 27 Apr. 2019, www.aljazeera.com/news/2019/4/27/sri-lanka-15-dead-in-gun-battle-with-bombing-suspects#:~:text=Military%20spokesman%20Sumith%20Atapattu%20said,he%20said%20in%20a%20statement.

[19] Gunaratna, Rohan. Sri Lanka's Easter Sunday Massacre: Lessons for the International Community. Penguin Books, an Imprint of Penguin Random House SEA, 2023.

[20] Welikala, Asanga. "Paradise Lost? Preliminary Notes on a Constitutional Coup." Centre for Policy Alternatives, 29 Oct. 2018, www.cpalanka.org/paradise-lost-preliminary-notes-on-a-constitutional-coup/.

[21] Welikala, Asanga. "Paradise Lost? Preliminary Notes on a Constitutional Coup." Centre for Policy Alternatives, 29 Oct. 2018, www.cpalanka.org/paradise-lost-preliminary-notes-on-a-constitutional-coup/.
[22] Radhakrishnan, R K. "Constitutional Coup." Frontline, 10 Nov. 2018, https://frontline.thehindu.com/world-affairs/article25436345.ece
[23] Miglani, Sanjeev, and Shihar Aneez. "Exclusive: Sri Lankan Ex-Defence Chief Gotabaya Says He Will Run for President, Tackle Radical Islam." Reuters, 27 Apr. 2019, www.reuters.com/article/idUSKCN1S3049/
[24] Miglani, Sanjeev, and Shihar Aneez. "Exclusive: Sri Lankan Ex-Defence Chief Gotabaya Says He Will Run for President, Tackle Radical Islam." Reuters, 27 Apr. 2019, www.reuters.com/article/idUSKCN1S3049/
[25] "Gotabaya Rajapaksa Sworn in as Sri Lanka's New President." Al Jazeera, Al Jazeera, 18 Nov. 2019, www.aljazeera.com/news/2019/11/18/gotabaya-rajapaksa-sworn-in-as-sri-lankas-new-president.
[26] "Remembering the Children of Batticaloa's Zion Church." Tamil Guardian, 21 Apr. 2020, www.tamilguardian.com/content/remembering-children-batticaloas-zion-church.
[27] Asos Billionaire Loses Three Children in Sri Lanka Attacks." BBC News, BBC, 22 Apr. 2019, www.bbc.com/news/business-48011075.
[28] Sri Lanka Attacks: Who Are the Victims?" BBC News, BBC, 26 Apr. 2019, www.bbc.com/news/world-asia-48002169.
[29] Koralage, Ama. "Tracing Roots and Winning Rights: The March of the Malaiyaha Tamil Community." Groundviews, 18 Aug. 2023, https://groundviews.org/2023/08/11/tracing-roots-and-winning-rights-the-march-of-the-malaiyaha-tamil-community/.
[30] Ravindran, Jeevan. "Malaiyaha Tamils' Long March to Equality in Sri Lanka." Himal Southasian, 15 Dec. 2023, www.himalmag.com/politics/malaiyaha-tamils-equality-sri-lankan-tea-estates#:~:text=In%20April%2C%20the%20World%20Bank,class%2C%20labour%20segmentation%20and%20ethnicity.
[31] Koralage, Ama. "Tracing Roots and Winning Rights: The March of the Malaiyaha Tamil Community." Groundviews, 18 Aug. 2023, https://groundviews.org/2023/08/11/tracing-roots-and-winning-rights-the-march-of-the-malaiyaha-tamil-community/.
[32] Koralage, Ama. "Tracing Roots and Winning Rights: The March of the Malaiyaha Tamil Community." Groundviews, 18 Aug. 2023, https://groundviews.org/2023/08/11/tracing-roots-and-winning-rights-the-march-of-the-malaiyaha-tamil-community/.
[33] Koralage, Ama. "Tracing Roots and Winning Rights: The March of the Malaiyaha Tamil Community." Groundviews, 18 Aug. 2023, https://groundviews.org/2023/08/11/tracing-roots-and-winning-rights-the-march-of-the-malaiyaha-tamil-community/.
[34] Suryanarayan , V. "The Plight of Tamils of Indian Origin in Sri Lanka." The New Indian Express, 22 Dec. 2021, www.newindianexpress.com/opinions/2021/Dec/22/the-plight-of-tamils-of-indian-origin-in-sri-lanka-2398239.html.
[35] Pokharel, Sugam, et al. "Bombs Tear through Sri Lankan Churches and Hotels, Killing 250 People." CNN, Cable News Network, 25 Apr. 2019, https://edition.cnn.com/2019/04/21/asia/sri-lanka-explosions/index.html
[36] Gunaratna, Rohan. Sri Lanka's Easter Sunday Massacre: Lessons for the International Community. Penguin Books, an Imprint of Penguin Random House SEA, 2023.
[37] "After Sri Lanka's Easter Bombings: Reducing Risks of Future Violence." Crisis Group, 17 Feb. 2021, www.crisisgroup.org/asia/south-asia/sri-lanka/302-after-sri-lankas-easter-bombings-reducing-risks-future-violence.
[38]"After Sri Lanka's Easter Bombings: Reducing Risks of Future Violence." Crisis Group, 17 Feb. 2021, www.crisisgroup.org/asia/south-asia/sri-lanka/302-after-sri-lankas-easter-bombings-reducing-risks-future-violence. .
[39] "Sri Lanka Vows 'maximum Force' against Anti-Muslim Rioters." BBC News, BBC, 14 May 2019, www.bbc.com/news/world-asia-48257299.
[40] Ethirajan, Anbarasan. "Sri Lanka's Muslims 'demonised' after Easter Bombings." BBC News, BBC, 13 Aug. 2019, www.bbc.com/news/world-asia-49249146.

[41] Gunasingham, Amresh. "Sri Lanka Attacks: An Analysis of the Aftermath." Counter Terrorist Trends and Analyses, vol. 11, no. 6, 2019, pp. 8–13. JSTOR, https://www.jstor.org/stable/26662255.

[42] "Doctor Arrested for 'Sterilising' Women in Sri Lanka Was Framed: Probe." NDTV.Com, 5 July 2019, www.ndtv.com/world-news/doctor-arrested-for-sterilising-women-in-sri-lanka-was-framed-probe-2064837.

[43] "Sri Lanka Bombings: All the Latest Updates." Al Jazeera, Al Jazeera, 2 May 2019, www.aljazeera.com/news/2019/5/2/sri-lanka-bombings-all-the-latest-updates#:~:text=Sri%20Lanka%20bans%20face%20coverings,statement%20from%20presidential%20office%20said

[44] Ethirajan, Anbarasan. "Sri Lanka's Muslims 'demonised' after Easter Bombings." BBC News, BBC, 13 Aug. 2019, www.bbc.com/news/world-asia-49249146.

[45] "Sri Lanka: Refugees Living in Fear Following Easter Sunday Attacks." Amnesty International UK, 16 May 2019, www.amnesty.org.uk/press-releases/sri-lanka-refugees-living-fear-following-easter-sunday-attacks.

[46] "Economy and Investments." Qatar Embassy in Colombo - Democratic Socialist Republic of Sri Lanka, https://colombo.embassy.qa/en/sri-lanka/economy-and-investments. Accessed 28 Mar. 2024.

[47] Wilson, Antonia. "Sri Lanka Ranked Top Country for Travel in 2019 by Lonely Planet." The Guardian, Guardian News and Media, 23 Oct. 2018, www.theguardian.com/travel/2018/oct/23/sri-lanka-ranked-top-country-for-travel-in-2019-by-lonely-planet.

[48] Wilson, Antonia. "Sri Lanka Ranked Top Country for Travel in 2019 by Lonely Planet." The Guardian, Guardian News and Media, 23 Oct. 2018, www.theguardian.com/travel/2018/oct/23/sri-lanka-ranked-top-country-for-travel-in-2019-by-lonely-planet.

[49] "UK Warns against All but Essential Sri Lanka Travel." BBC News, BBC, 25 Apr. 2019, www.bbc.com/news/uk-48057838.

[50] "The Impact of the Easter Sunday Attacks." Central Bank of Sri Lanka- Annual Report 2019, 2019, pp. 186–187.

[51] "SL Tourism Statistics." High Commission of the Democratic Socialist Republic of Sri Lanka in the United Kingdom, https://srilankahc.uk/sl-tourism-statistics/. Accessed 28 Mar. 2024.

[52] "The Impact of the Easter Sunday Attacks." Central Bank of Sri Lanka- Annual Report 2019, 2019, pp. 186–187.

[53] "Long-Term Impact of Easter Sunday Attacks on SMEs." Market Development Facility, https://marketdevelopmentfacility.org/wp-content/uploads/2020/01/MDF-Brief-Long-term-Impact-of-Easter-Sunday-Attacks-on-SMEs.pdf. Accessed 28 Mar. 2024.

[54] "Long-Term Impact of Easter Sunday Attacks on SMEs." Market Development Facility, https://marketdevelopmentfacility.org/wp-content/uploads/2020/01/MDF-Brief-Long-term-Impact-of-Easter-Sunday-Attacks-on-SMEs.pdf. Accessed 28 Mar. 2024.

[55] The Impact of the Easter Sunday Attacks." Central Bank of Sri Lanka- Annual Report 2019, 2019, pp. 186–187.

[56] The Impact of the Easter Sunday Attacks." Central Bank of Sri Lanka- Annual Report 2019, 2019, pp. 186–187.

[57] The Impact of the Easter Sunday Attacks." Central Bank of Sri Lanka- Annual Report 2019, 2019, pp. 186–187.

[58] Sirasa, "News 1st: Prime Time Sinhala News - 7 Pm: (23/11/2021) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති." YouTube, 23 Nov. 2021, www.youtu.be/ruDYyKlETCQ?t=1393.

[59] "Written statement* submitted by Franciscans International, a non-governmental organization in general consultative status." United Nations, 5 Feb. 2024.

[60] Trial monitoring report on 18th of February, 2022 – Case No: HC (TAB) 2900/21 and Case No: HC (TAB) 2899/21

[61] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 182 ඡේදය සහ *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 173 ඡේදය

[62] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 18 ඡේදය සහ *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 19 ඡේදය

[63] "SC FR 163/2019." Supreme Court, https://www.supremecourt.lk/images/documents/sc_fr_163_2019.pdf. Accessed 28 Mar. 2024.
[64] Centre for Society and Religion. "The Highlights of 11 Main Easter Attacks Court Cases (1st January 2021- 21st June 2023)," Centre for Society and Religion, 21st June 2023. https://easterattack.info/csr-reports/.
[65] "Action Taken by OR on Orders Made by the Supreme Court." Office for Reparations - Sri Lanka, https://reparations.gov.lk/web/index.php?option=com_content&view=article&id=153%3Aaction-taken-by-or-on-orders-made-by-the-supreme-court&catid=8%3Anews-and-events&lang=en&Itemid=282. Accessed 28 Mar. 2024.
[66] Fernando, Ruki. "Justice for Easter Sunday and Justice for Hejaaz: A Christian Perspective." EconomyNext, 24 May 2020, economynext.com/justice-for-easter-sunday-and-justice-for-hejaaz-a-christian-perspective-70287/.

[67] "Immediate Release of Lawyer and Prisoner of Conscience Hejaaz Hizbullah." Tamil Guardian, 26 Aug. 2021, https://www.tamilguardian.com/sites/default/files/Image/pictures/Namal%20Rajapaksa/Immediate%20Release%20of%20Lawyer%20and%20Prisoner%20of%20Conscience%20Hejaaz%20Hizbullah%20-%2026Aug2021%20(English).pdf.

[68] "Immediate Release of Lawyer and Prisoner of Conscience Hejaaz Hizbullah." Tamil Guardian, 26 Aug. 2021, https://www.tamilguardian.com/sites/default/files/Image/pictures/Namal%20Rajapaksa/Immediate%20Release%20of%20Lawyer%20and%20Prisoner%20of%20Conscience%20Hejaaz%20Hizbullah%20-%2026Aug2021%20(English).pdf.
[69] Trial monitoring report on 14th of October, 2022– Case No: 23084/22

[70] Trial monitoring report on 14th of October, 2022– Case No: 23084/22
[71] Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.
[72] Trial monitoring report on 17th of June, 2022– Case No: HC 4485/21
[73] Centre for Society and Religion. "The Highlights of 11 Main Easter Attacks Court Cases (1st January 2021- 21st June 2023)," Centre for Society and Religion, 21st June 2023. https://easterattack.info/csr-reports/.
[74] Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.
[75] Samaraweera, Buddhika. "Poet Ahnaf Jazeem Acquitted." Latest in the News Sphere | The Morning, Liberty Publishers, 12 Dec. 2023, www.themorning.lk/articles/Rg7ob4f7ixHw51ZJlzUq.

[76] "Written statement* submitted by Franciscans International, a non-governmental organization in general consultative status." United Nations, 5 Feb. 2024.
[77] Fernando, Ruki. "AHNAF JAZEEM: The Silenced Poet." Slcat, 18 May 2021, www.slcat.org/ahnaf-jazeem-the-silenced-poet-ruki-fernando/.
[78] "Sri Lanka: Poet Detained for One Year without Charge: Ahnaf Jazeem." Amnesty International, 6 June 2021, www.amnesty.org/en/documents/asa37/4119/2021/en/.
[79] "After Sri Lanka's Easter Bombings: Reducing Risks of Future Violence." Crisis Group, 17 Feb. 2021, www.crisisgroup.org/asia/south-asia/sri-lanka/302-after-sri-lankas-easter-bombings-reducing-risks-future-violence.
[80] "Sri Lanka Arrests Muslim Leader over 2019 Easter Sunday Attacks." Al Jazeera, Al Jazeera, 24 Apr. 2021, https://www.aljazeera.com/news/2021/4/24/sri-lanka-arrests-muslim-leader-over-easter-attacks#:~:text=Nearly%20200%20people%20were%20arrested,of%20progress%20in%20the%20investigation.
[81] "Protest in Sri Lanka on Fourth Anniversary of Easter Bombings." Al Jazeera, Al Jazeera, 21 Apr. 2023, www.aljazeera.com/news/2023/4/21/protest-in-sri-lanka-on-fourth-anniversary-of-easter-bombings#:~:text=Officials%20have%20charged%20dozens%20of,punished%20for%20this%20brutal%20attack

[82] Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.

[83] Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.
[84] Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.
[85] "After Sri Lanka's Easter Bombings: Reducing Risks of Future Violence." Crisis Group, 17 Feb. 2021, www.crisisgroup.org/asia/south-asia/sri-lanka/302-after-sri-lankas-easter-bombings-reducing-risks-future-violence.

[86]Pokharel, Sugam, et al. "Bombs Tear through Sri Lankan Churches and Hotels, Killing 250 People." CNN, Cable News Network, 25 Apr. 2019, https://edition.cnn.com/2019/04/21/asia/sri-lanka-explosions/index.html.

[87] Radhakrishnan, R K. "Constitutional Coup." Frontline, 10 Nov. 2018, https://frontline.thehindu.com/world-affairs/article25436345.ece
